# රණවරුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

26 වන කලාපය | 2017 - නොවැම්බර් - 2018 ජනවාරි

## 2018 සුබ නව වසරක් වේවා...!





## අබිමන් මෙහෙයට ගෞරවනීය සම්ප්‍රාප්තිය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 35 වැනි සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී 2017 දෙසැම්බර් මස 06 වන දින සිය තනතුරෙහි රාජකාරී භාරගත් අවස්ථාව...





තවත් ඡායාරූප 5 පිටුවේ...

"ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ස්වේච්ඡා බළසේනාව ඉතා දීර්ඝ ඉතිහාසයක් හිමි සංවිධානයක්. අද වනවිට බළඇණි 100 කින් සමන්විත ස්වේච්ඡා බළසේනාව යුද්ධ හමුදාව තුළ තිබෙන ශක්තිමත්ම සහ පුළුල්තම සංවිධානයයි. ස්වේච්ඡා බළසේනාවේ නිළධාරීන් හා සෙබළුන් යුද හමුදාවේ බොහෝ අංශයන්හි ඉතාමත් ඉහළ දක්ෂතාවන් දක්වනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පරම වීර විභූෂණය දිනාගත්ත පළමුවෙනි නිළධාරියා බිහිවුණේ යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන්. ඒ තමයි කපිතාන් සාලිය අලදෙනිය. ඒ වගේම ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඉතිහාසය අධ්‍යයනය කරද්දී ලුතිනන් ඩන්කන් වයිට්, සුසන්තිකා ජයසිංහ ඔලිම්පික් පදක්කම් ලාභින් ලෙස රටට ඉමහත් කීර්තියක් ගෙනදුන්නා. අප රට තුළ ඉහළින්ම වැජඹෙන ප්‍රභූවරුන් ස්වේච්ඡා බළසේනාවෙන් බිහිවී තිබෙනව. ප්‍රථම අග්‍රාමාත්‍ය මහාමාන්‍ය ඩීඑස් සේනානායක, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල, ජෙනරාල් අනුරුද්ධ රත්වත්ත, වත්මන් පාර්ලිමේන්තුවේ ගරු කථානායක කරු ජයසූරිය ඉන් වඩාත් කැපීපෙනෙනවා. මින් ඉදිරියටත් අපට හැකියාව තියෙනවා එවැනි ප්‍රභූවරුන් අපි අතරින් බිහිකරන්න. විශේෂයෙන්ම ස්වේච්ඡා බළසේනාව යුද්ධ හමුදාවේ අන් අයවලුන්ට ශක්තියක් විය යුතුයි"

- ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 35 වැනි සේනාවිධායක ලෙස පත්වූ මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී 2017 දෙසැම්බර් මස 06 වන දින සිය තනතුරෙහි රාජකාරී භාරගනිමින්...

# ඇතුළු පිටු


04 විශිෂ්ට මෙහෙවරක ගෞරවනීය නික්ම යෑම

12 කිසිම දෙයකින් කලකිරෙන්න එපා

15 පුන්සඳ රෑට ඇවිදින්

20 ඒකක චිත්ති

24 ජනසෙත සදමින්

27 බුදුදහම තුළින් රෝග සුවය හා මානසික සහනය

36 පය ඇඳි බිම ළය රැඳි මතක

42 පවුල් සංවිධානය



# රණවරුණ


**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය

**උපදේශක මණ්ඩලය**

බ්‍රිගේඩියර් එල්එෆ් කස්තුරිආරච්චි
බ්‍රිගේඩියර් මායාදුන්නේ ආර්එස්පී
කර්නල් එම්ජීඒඑන්බී මහතුවක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

**සංස්කාරක**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ

**'රණවරුණ" කාර්ය මණ්ඩලය**

ලුතිතන් එච්පීඑම්පීබීඑම් පළිහක්කාර ශ්‍රීලංජාආබමු
ලා/කෝප්‍රල් සුජීව කුමාර කෝවිලතැන්න (සැකසුම් සහය)
බනිII සුසිරිපාල ඩබ්ලිව්එම්
කෝප්‍රල් කුමාර පීඩබ්ලිව්ඩබ්ලිව්පීඑස්එම්
ලා/කෝප්‍රල් සාලිය බණ්ඩාර යූඕජී
ලා/කෝප්‍රල් චාමර එම්කේආර්එල්
ලා/කෝප්‍රල් කීර්තිරත්න ඒඑම්ටීඑස්
ලා/කෝ දයාරත්න
සාසෙ බොතේජු පීඩබ්ලිව්ඩබ්ලිව්
සාසෙ පෙරේරා එච්ආර්පීඩබ්ලිව්



**රණවරුණ ලිපිනය**

සංස්කාරක
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය
යුද හමුදා කඳවුර
සාලාව - කොස්ගම

ඊමේල් ranawaruna@yahoo.com
දුරකතන - 036 2255 362
ෆැකස් - 036 2255 709



**පරිගණක නිර්මාණය හා මුද්‍රණය**

නියෝ ග්‍රැෆික්ස්


## එළැඹි වසරේ බලාපොරොත්තු දැල්වේවා.

බොහෝ මතක සටහන් රැඳි දොළොස් මසක් ගෙවී අවසන්ය. අලුත් ලෙස ජිවිතය දෙස බලන්නට උදාවී ඇත්තේ අනගි අවස්ථාවකි. "එළැඹි වසර සුබවේවා" යන්න සැමගේ ආශිර්වාදයයි. එහෙත් ආශිර්වාද හා සුබ පැතුම් වලින් පමණක් නව වසර අර්ථවත් නොවේ. ඒ සඳහා අපගේද කැපවීම අවශ්‍යමය. හමුදා සාමාජිකයින් ලෙස තනි තනිව හා සාමූහිකව අප වෙත පැවරෙන යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු කිරීමට නව වසරේ අදිටන් කර ගනිමු. එලෙසින්ම වෘත්තීය ජිවිතය සේම පෞද්ගලික ජීවිතයද හරියාකාරව කළමනාකරණය කරගැනීමද වැදගත්වේ.

අනවශ්‍ය දේ බැහැර කරමින් අවශ්‍ය දේ පමණක් පසුගිය වසරෙන් ඉදිරියට ගෙන ආ යුතුය. ගිය වසරේ සැලසුම් කළ, සාර්ථක නොවූ, එසේත් නොමැතිනම් අතරමඟ නවතා දැමූ යහපත් කටයුතු සියල්ල මේ වසරේ නිසැකවම සඵල කරගන්නා බවට තිර අදිටනින් පසුවන්න. යුද හමුදා සාමාජිකයින් ලෙස පසුබෑම්, බිඳවැටීම්, අසාර්ථකවීම් වලට අපි කොතෙකුත් මුහුණදී ඇත්තෙමු. පසුගිය තිස් වසක් පුරා පැවති යුද්ධය හමුවේ එවැනි අත්දැකීම් අපට ඕනෑ තරම් තිබේ. නමුත් අවසානයේ අප ඒ සියල්ල අභිබවා ජයග්‍රහණය ලැබුවේ කැපවීම අධිෂ්ඨානය හා නිවැරදි සැලසුම් හේතුවෙනි. එබැවින් එම ආදර්ශය වර්තමානයේද ඔබගේ වෘත්තීය හා පෞද්ගලික ජිවිතවලට ආරෝපණය කරගන්න.

2018 වසර නිසැකවම ජය ලැබෙන, සුව ගෙනෙන, හිත හැදෙන වසරක් කර ගනිමු. ඒ සඳහා දිරිය වීරිය ඔබට ලැබේවායි "රණවරුණ" ද මෙසේ සුපැතුම් පිරිනමයි.

සංස්කාරක

# විශිෂ්ට මෙහෙවරක
# ගෞරවනීය නික්ම යෑම

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක ධූරය හෙබවූ මේජර් ජෙනරාල් එම්එච්එස් බොනිෆස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ඉකුත් නොවැම්බර් 30 වනදා සිය ධූරයෙන් සමුගත්තේය. ස්වේච්ඡා බළසේනාවේ 34 වන සේනාවිධායක ලෙස වැඩ භාරගත් ඔහු සිය කාලසීමාව තුළ ස්වේච්ඡා බළසේනාව නව මානයකට ගෙනයමින් ගුණාත්මක හා කාලීන වෙනස්කම් රැසක් සිදුකිරීමට සමත් විය.

ස්වේච්ඡා බළසේනාවේ අභියෝගාත්මක කාලපරිච්ඡේදයක සිය තනතුර භාරගත් හෙතෙම සාලාව කඳවුරු පරිශ්‍රයේ සිදුව තිබූ ව්‍යසනය හේතුවෙන් භෞතික වශයෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබූ ස්වේච්ඡා බළසේනා මූලස්ථානය යළි ගොඩනැංවීමේ දැවැන්ත කාර්යභාරයේ නියමුවාද විය.

වසර 137 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් ඇති ස්වේච්ඡා බළසේනාව තුළ නොමැකෙන මතක සටහන් එක් කරමින් නික්ම ගිය සේනාවිධායක තුමනි, මේ ගෞරවනීය උපහාර සටහන ඔබ වෙනුවෙනි.











## ඓතිහාසික දිනයක

# අභිමානවත් මතකසටහන්...













## සංචාරයක සටහන්





පසුගිය ජනවාරි 31 දින යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එන්යුඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී කොස්ගම සාලාව කඳවුරු පරිශ්‍රයේ සංචාරයක නිරත වුයේය. එහිදී යුද හමුදාපති තුමන් ස්වේච්ජා බළසේනා මුලස්ථානයේ එවක සිදුවූ පිපිරීම හේතුවෙන් විනාශයට පත් වූ භූමිය නිරීක්ෂණය කළ අතර, පසුව අභිනවයෙන් ඉදිකෙරෙන ස්වේච්ජා බළසේනා මුලස්ථානයේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ සොයා බැලීමටද එක්විය. මෙම අවස්ථාවට ස්වේච්ජා බළසේනා සේනාවිධායක, භකාස අණසක ආඥාපති, ස්වේච්ජා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක , මුලික මාණ්ඩලික නිළධාරි ඇතුළු නිළධාරීහූ රැසක් සහභාගි වුහ.



## “රණවිරු හරිත අරණ”

# වන රෝපා ජාතික රුක්රෝපණ වැඩසටහන





අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක “රණවිරු හරිත අරණ” වන රෝපා ජාතික රුක්රෝපණ වැඩසටහන යටතේ 6(සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකායද ඊට අයත් වැලිකන්ද කන්දකාඩු ගොවිපොල් පසුගියදා රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒ යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙනි. එහිදී යුද්ධ හමුදාධිපති තුමන් අතින් කන්දකාඩු ගොවිපොලෙහි ඉදිකරන ලද නව වී ගබඩාව විවෘත කැරුණු අතර මෙම අවස්ථාවට යුද හමුදා පොදුසේවා බලකා බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර් පලිහක්කාර යූඑස්පී ඇතුලු නිළධාරිහූ ද සෙසුනිලයෝ විශාල පිරිසක්ද ප්‍රදේශයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ රැසක්ද එක්වුහ.

# අබිමන් මෙහෙයට බුහුමන් ලැබූ වගයි





ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ 13 වැනි රෙජිමේන්තු අධිපති ලෙස පුරා වසරකට වැඩි ගෞරවනීය මෙහෙයක් ඉටුකොට මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්පී එන්ඩීයූ පීඑස්සී පසුගියදා සිය ධුරයෙන් සමුගන්නා ලදී.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ උන්නතිය වෙනුවෙන් අපරිමිත සේවයක් ඉටුකළ නික්ම ගිය සේනාවිධායක සිය කාල පරාසය තුළදී නවීන අංගෝපාංගයන්ගෙන් පරිපූර්ණ ශ්‍රවණාගාරයක් ඉදිකොට ඒයට නවීන ශබ්ද විකාශන පද්ධතියක් හා වේදිකා ආලෝකන උපාංග පද්ධතියක් සැපයීම, නවීන පරිගණකවලින් සමන්විත පරිගණක විද්‍යාගාරයක්, සුවිසල් පොත් එකතුවක් සහිත නවීන පුස්තකාලයක් මෙන්ම කියවීම් ශාලාවක් ඉදිකරීම, රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව සඳහා කාර්යාලයක් ඉදිකිරීම වැනි කාර්යයන් රැසක් සිදුකරනු ලැබීය. තවද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සරඹ ශූරයින් ලෙස කිරුළු පැළඳි ශ්‍රීලංජාආබමු රෙජිමේන්තුවට අත්‍යවශ්‍යව තිබූ සරඹ භූමියක් මෙතුමන් ගේ පූර්ණ මැදිහත්වීම හා කැපවීම තුළින් සපුරා ගැනීමට හැකිවීම විශේෂත්වයකි.

මෙවන් ඓතිහාසික සේවාවන් රැසක් ඉටුකළ හිටපු රෙජිමේන්තු අධිපති වෙත සිය සමුගැනීම නිමිත්තෙන් කඳවුරු සම්මාන මුරයක් හා එතුමන්ගේ මැදිහත්වීමෙන් ඉදිකළ නව සරඹ භූමියේ සම්මාන මුරයක් ද පිරිනමමින් රෙජිමේන්තුවේ ගෞරවය පුදකරන ලදී. තවද සියලු නිළ තේපැන් සංග්‍රහයකට ද එක්වූ හිටපු රෙජිමේන්තු අධිපති රෙජිමේන්තු රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්විමට ද අමතක නොකළේය. එසේම යුද හමුදා සම්ප්‍රදායන්ට අනුව ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු නිලධාරි නිවස්නයේ එතුමන් වෙනුවෙන් රාත්‍රි භෝජන සංග්‍රහයක්ද පැවත්විණි. මෙම අවස්ථාවට රුවිනි සුජීවා වික්‍රමරත්න මැතිනිය රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීඑච්එම්ඩඩබ් තම්මිට, නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරිහූ රැසක්ද, සෙසු නිළයෝ විශාල පිරිසක් ද එක්වූහ. නික්ම ගිය සේනාවිධායක වෙත ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙතින් කෘතගුණ දැක්වීමේ සමරු තිළිණ ප්‍රදානයක් ද එදින සිදුකරන ලදී.

# නව අණදීමක ආරම්භය



වසර 27 ක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවෙහි, 14 වන රෙජිමේන්තු අධිපති වශයෙන් මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ඒඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් 2017 දෙසැම්බර් මස 13 දින රාජකාරී භාරගනු ලැබීය. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් වසර 33 ක සේවා කාලයක් සපුරා ඇති, නව රෙජිමෙන්තු අධිපති මව්බිමේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාව උදෙසා දියත්කරන ලද ක්‍රියාන්විතයන් රැසකට තම සක්‍රීය දායකත්වය සපයා ඇති, දක්ෂ නිලධාරියෙකි. යුද්ධ හමුදාවේ අණදීමේ සහ මාණ්ඩලික තනතුරු රැසක් ද හොබවා ඇති හෙතෙම යුද හමුදාවේ විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ බොහෝ අත්දැකීම් සපිරි නිලධාරියෙක් ද වන්නේය.

නව රෙජිමේන්තු අධිපතිගේ රාජකාරි භාරගැනීම නිමිත්තෙන් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කළ අතර, එම අවස්ථාවට රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීඑච්එම්ඩඩබ් තම්මිට, නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් නලීන් බංඩාරනායක යූඑස්පී ඇතුළු රෙජිමේන්තු මන්ත්‍රණ සභා සාමාජිකයින්, රෙජිමේන්තු මධ්‍යස්ථාන මාණ්ඩලික නිලධාරීන්, ඒකක අණදෙන නිලධාරීන්ද ඇතුළු සෙසු නිළයෝ රැසක් සහභාගී වූහ.

## ඒකක අභිමන්
# සමරමින්...





### 1 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව

1වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ 28 වන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරී මේජර් පීඑම්පී කොස්තා - ශ්‍රීලංජාආබමු ගේ ප්‍රධානත්වයෙන් වාරියපොල වැවගෙදරවත්ත කඳවුරේදී අභිමානවත් අයුරින් සමරන ලදි.

### 16 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව

16 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ 25 වන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරී මේජර් ඩීආර්එම්බී දිසානායක-ශ්‍රීලංජාආබමු ගේ ප්‍රධානත්වයෙන් අන්නමලේ කඳවුරේදී අභිමානවත් අයුරින් සමරන ලදි.





### 19 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව

ලක්ෂපාන ප්‍රදේශයේ ස්ථානගත 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සිය 21 වන සංවත්සරය අභිමානවත් අයුරින් පසුගියදා වැ. බ. අණදෙන නිලධාරි මේජර් ඒඩී ගුණවර්ධන ශ්‍රීලංජාආබමුගේ ප්‍රධානත්වයෙන් යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් දෙමින් සමරන ලදී.

### 18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව

වාකරේ පනිච්චන්කර්නි ප්‍රදේශයේ ස්ථානගත 18 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සිය 21 වන සංවත්සරය වැ.බ. අණදෙන නිලධාරි මේජර් එම්පීඩී ප්‍රේමවංශ ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සමරන ලදී.

### 15 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව

15 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සිය 25 වන සංවත්සරය අභිමානවත් අයුරින් පසුගියදා වැ.බ. අණදෙන නිලධාරී මේජර් ආර්එම් ආනන්ද ශ්‍රීලංජාආබමුගේ ප්‍රධානත්වයෙන් සමරන ලදී. ආගමික වතාවත්වලට ප්‍රමුඛත්වයක් දෙමින් පැවති මෙම සැමරුම් උත්සවයට මියගිය රණවිරුවන් සිහිපත් කිරීම, ලේ දන්දීමේ පුන්‍ය කර්මයක් සිදුකරීම ආදි සැමරුම් වැඩසටහන් රාශියක් ඇතුළත්ව තිබිණ.



# ඒකක අභිමන් සමරමින්...



## 9 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව

කැලණිමුල්ල අංගොඩ ප්‍රදේශයේ ස්ථානගත 9 වන (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව සිය 24 වන සංවත්සරය පසුගියදා අභිමානවත් අයුරින් වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් දෙමින් සමරන ලදී.



## 17 (සෙව්) ගජබා රෙජිමේන්තුව

17 (සෙව්) ගජබා රෙජිමේන්තුව සිය 10 වන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරී මේජර් එස්එම්ජී සෝමතිලක ගරෙ ගේ ප්‍රධානත්වයෙන් භාරතිපුරම් කඳවුරේදී අභිමානවත් අයුරින් සමරන ලදි.



## 16 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට නවක ඒකකයක් ලෙස 2007.12.01 වන දින එක්වූ 16 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව සිය සාඩම්බර ගමන් මගෙහි දහවන සංවත්සරය පසුගියදා උත්කර්ෂවත් අන්දමින් කිළිනොච්චි තිරුවයිආරු බටහිර ග්‍රාමයේ දී වැ.බ. අණදෙන නිලධාරී මේජර් යුආර්එල් පෙරේරා ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් සමරන ලදී.



## 2 (සෙව්) ගැමුණු හේවා බළඇණිය

යාපනය මාවඩ්ඩිපුරම් ප්‍රදේශයේ ස්ථානගත 2(සෙව්) ගැමුණු හේවා බළඇණිය සිය 58 වන සංවත්සරය වැ.බ. අණදෙන නිලධාරී මේජර් ඊආර්ටීජ් සමරකෝන් ගැහේබ ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා අභිමානවත් අයුරින් සමරන ලදි.

# සුබ නව වසරක් ඇරඹූ වගයි...





උදාවූ 2018 වර්ෂය අතිගරු ජනාධිපති තුමන්ගේ සංකල්පයකට අනුව ආහාර නිෂ්පාදන වර්ෂය ලෙසින් නම්කර ඇත. ඒ අනුව තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් තුළින් අප මාතෘභූමිය ස්වයංපෝෂිත කිරීම ප්‍රමුඛ අරමුණ කරගනිමින් හා රාජ්‍ය සේවකයින් තුළ කැපවීමෙන් වැඩකිරීමේ ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් 2018 වර්ෂයේ රාජකාරී අරඹන පළමු දින ජාතික මට්ටමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාවට නැංවිණ.



ඒ අනුව ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේද ඉහත අරමුණ පෙරදැරිව 2018 ජනවාරි 02 වන දින වැඩසටහනක් සංවිධානය කෙරුණු අතර ඊට ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය. ජාතික හා යුද හමුදා ධජ එසවීම, රාජ්‍ය සේවක ප්‍රතිඥාව ලබා දීම, යුද හමුදාපති තුමාගේ පණිවුඩය කියවීම, සියලු නිළ තේ පැන් සංග්‍රහය, ස්වේච්ඡා බළසේනා සේනාවිධායක විසින් හට පිරිස් අමතනු ලැබීම එම වැඩ සටහන් අතර විය. එම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් එල්එෆ් කස්තුරිආරච්චි ඇතුලු සියලුම ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීහුද රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සෙසු නිළයෝද, සිවිල් සේවකයෝද සහභාගි වූහ.



කවි
# මල් යාය

## ආදර මාවත

ජීවිතය නමැති මහ මගේ
ආදරය නමැති
අතුරු මාවත වෙත පිවිසි අප
විවාහය නමැති
පටුමගෙහි
නැවතී
සෙනෙහස
ආදරය
කරුණාව  නමැති
සෙනෙහෙබර
කැදැල්ල තැනීමට
සිහින දකින්නෙමු..

**සෙ/එල්100181**
**සාසෙ සත්‍යා ජයන්ත පීජේ**
**2(සේවි)ශ්‍රීලයුවෙබ**

## අම්මා

දස මසක් කුස දරා
අනේක විද දුක් ගැහැට
විඳිමින්
මා හැදූ මගේ අම්මා

දහසක් සෙනෙහසින්
ආදර වදන් වලින්
ලොවම කියා දුන්
මගේ අම්මා

ලෙඩ ඇඳේ වැතිර ඉඳ
මරු සමඟ සටන් කර
ජීවිතය ජයගන්න
වෙර දරූ අම්මා

ජීවිතය අනියත බව
පුතේ දැන ගන්න
යයි කියාදෝ
පවසන්න වෙර දරා
අවසන් සුසුම් හෙලූ
රත්තරන් අම්මා

**මේජර් කේකේඑස් කුමාර**
**ශ්‍රීලංජාආබමු**

## අතීතය

බිහිසුණු අතීතයක් තිබුණා අපටත්...
ගමේ හැම තැන හැම මිනිසුන් ලග
දුක, කඳුල, බිය පමණයි ඉතිරිව තිබුණේ
නැහැ සතුටක් සැනසිල්ලක් ඔවුනට ලැබුණේ...
හදවත උණුවන සෙල්ලක්කාර යෞවන අවධියේ සිටි අප
දුටුවෙමි හැම දින
ඒ මිනිසුන් ලග ඇති බිය, දුක, කඳුල
සීල්කරපු මිනී පෙට්ටියෙන් ගමට ආ සොයුරන් සැම...
බැරි වුනි දකින්නට ඉවසන්නට අපට එවන් දුක
අදිටන් කර ගත්තෙමු අප
යුද්ධය නමැති ඒ බිහිසුනු නරකාදිය නිමා කරන්නට
එක් වුනි අප සැම හමුදාවට
දුක් කරදර බාධා මැද පුහුණුව ලැබ
ආවා උතුරුකරයට...
ඇසුනෙමි වෙඩි හඬ තල් ගස් අරනේ හතර කොනේ...
රෑ දහවල් විසිහතර පැයේ
නැහැ දැනුනේ නින්දක්
නොදැනුනෙමි කුසට ගින්නක්
මාපියන් නෑසියන් සිහිවෙයි නිතර දෙවේලේ...
ලේ දහඩිය වැගිරෙමින්
යුධ බිමේ සොහොයුරන් කැල මියැදෙයි දිනෙන් දින...
එනමුදු අප සැම
දඟකාර හැඩකාර මුත් යෞවනයම කැප කර
එකට එක්වී
නිමා කළා ඒ බිහිසුනු යුද්ධය...
උදාකලා මව්බිමට
සතුට නිදහස සාමය හැමදාටම.....
නැත යලිත් එන්නේ
ඒ හිත හිරිවට්ටන බිහිසුණු යුද්ධය...

**සෙ/කියු104364 සාසෙ බංඩාර කේඑම්ඒඑච්**
**23 ශ්‍රීලංජාආබමු**

## දයාබර පුංචි දුවට...

නිතරම සිනා නංවාගෙන මුවග පුරා
දුවපැන නටනවා සැමදා මිඳුල පුරා
වැටි වැටි දුවනවා අපගේ පුංචි සරා
මගෙ දූ වෙතට කවි ලියවෙයි කොලය පුරා

සපුරා තෙවසරක කාලය ලග එනවා
සුරතල් බල බලා සැමදා හිනැහෙනවා
දවසෙම වඩාගෙන මිදුලෙහි ඇවිදිනවා
කඳ සුරිඳුනේ සැමදා ඈ රැකදේවා .........

**සෙ/165එච්00627**
**සාසෙ අබේසිංහ ඒඩීසී**
**16 (සේවි) විජයබාහු පාබල රෙජිමේන්තුව**



## සතුට සහ සාර්ථකත්වය සඳහා
## ජීවිත කළමනාකරණ උපාය මාර්ග

පසුගිය කලාපය හා බැඳේ...

# කිසිම දේකින් කලකිරෙන්න එපා! ඒ වෙනුවට හැමවිටම බලාපොරොත්තු සහගත වන්න...

ජීවිතය අනිවාර්ය පාඨමාලවකි. එම පාඨමාලාව සාර්ථකව නිමකිරීමට නම් ඊට අයත් විෂය නිර්දේශය පිළිබඳව නිවැරදි අවබෝධයක් අප සතුව තිබිය යුතුය. ජීවිතයේ අප කැමැති දේවල් මෙන්ම කිසිදා අපේක්ෂා නොකරන දේවල ද පිරිනමයි. එය මෙම පාඨමාලාවේ ස්වභාවයයි. එබැවින් ඒ පිළිබඳව කලකිරීමෙන් පලක් නැත. ජීවිතයේ දුෂ්කර අවස්ථා පැමිණෙන්නේ අපට පමණක් නොවේ. මෙලොව උපදින සියල්ලන්ටම එවැනි දුෂ්කරතා පැමිණේ. එබැවින් ඒවායින් කම්පා වීමෙන් පලක් ද නැත.

අප විසින් ප්‍රගුණ කළයුතු වන්නේ එවන් දුෂ්කර ජීවිතයට මුහුණදීමේ හැකියාවයි. එම හැකියාව අප සියල්ලන්ම සතුව පවති. කළයුතු වන්නේ සහ කළහැකි වන්නේ දුෂ්කරතා වළක්වා ගැනීම නොව ඒවාට සාර්ථකව මුහුණ දිය හැකි පෞරුෂයක් ගොඩනගා ගැනීම පමණි. ජීවිතයේ සියලු සිදුවීම් අපට වාසිදායක සහ අප කැමැතිවන ආකාරයට පාලනය කිරීමේ හැකියාවක් මිනිසුන්වන අප සතුව නැහැ. එම යථාර්ථය අවබෝධකොට ගෙන අපට පාලනය කළ නොහැකි දේ අතහරින්න. එවිට ආතතිය ඔබ අතහැර දමාවී.

මිනිසුන් බොහෝ දෙනෙකු ජීවිතය පිළිබඳ ඉක්මනින්ම කළකිරීමට පත්වන හේතුව වන්නේ අතාර්කික අපේක්ෂාවන්ය. අප ජීවිතයෙන් බොහෝ දේ බලාපොරොත්තු වන්නෙමු. එකී බලාපොරොත්තු අප අපේක්ෂා කරන තරම් වේගයකින් යථාර්ථයන් බවට පත් නොවන විට අප ඉක්මනින්ම කළකිරීමට පත්වන්නෙමු. සමස්ත විශ්වයටම අදාළව සිදුවීම් සිදුවන්නේ ඒවා සිදුවීමට නියමිත නිශ්චිත අවස්ථාවන්හිදී මිස අපට අවශ්‍ය අප බලාපොරොත්තුවන අවස්ථාවන් වලදී නොවේ.

ජීවිතය සර්ව සාධාරණ සිදුවීමක් නොවේ. එය එසේ කරගැනීමේ හැකියවක් ද අප සතුව නැහැ. ඒ නිසාම ඕනෑම මොහොතක අප අකමැති සිදුවීම් සිදුවෙන්න හොඳටම ඉඩ තිබේ. ඉතින් සොබාදහමේ න්‍යායට අනුව මේ ලෝකයේ වෙනත් ඕනෑම අයෙකුට සිදුවී තිබෙන අශුභ සිදුවීමක් අපටත් සිදුවෙන්න  පිළිවන්. අප ආදරය කරන අය මියයෑම, සුව කිරීමට නොහැකි රෝගාබාධයන්ට ගොදුරුවීම, අබාධිත සහිත දරුවන් ඉපදීම, ධනය හෝ දේපොළ අහිමිවීම, අවිවාහකව කල් ගෙවීමට සිදුවීම, හුදකලා බවට පත්වීම වැනි දේවල් අපටත් වෙන්න පුළුවන්.

ඔබ අකමැති කිසියම් සිදුවීමක් ඔබට සිදුවීමට යනවිට එය වළක්වාගැනීමටත්, වැළැක්වීමට නොහැකි නම් එහි දුර්විපාකයන් අවම කරගැනීමටත්, කළහැකි සියල්ලම උපරිම කැපවීමකින් කළයුතුයි. ඒ සියල්ල  මැනවින් සහ ඔබේ උපරිමයෙන් කර තිබියදිත් එකී අවාසනාවන්ත සිදුවීම හා එහි දුර්විපාකයන් ඔබට නවත්වාගැනීමට නොහැකි නම් ඔබ කළ යුත්තේ කුමක්ද?. තමන් හට කළ හැකිව තිබූ සියල්ල කර තිබියදිත් මගහරවා ගැනීමට නොහැකි අවාසනාවන්ත සිඳුවිම් සිඳුවීම ජීවිතයේ ස්වභාවයයි. අපට කළහැක්කේ එවා සුබවාදීව භාරගෙන ඒවාට සුබවාදීව මුහුණ දීමයි.

ඔබ අකමැති දේවල් සිඳුවන විට පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන්න.

1. එය මගහරින්න.
2. එය මගහැරීමට නොහැකි නම් වෙනස් කිරීමට උත්සාහ කරන්න.
3. මගහැරීම සහ වෙනස් කිරීම යන දෙකම කළ නොහැකිවූ විට එය භාරගන්න.
4. එය භාරගැනීම සඳහා ආකල්ප වෙනස් කරගන්න.

ඉතින් අපට සාර්ථක ජීවිතයක් ගොඩනගාගන්න උවමනා නම් මෙන්න මේ යථාර්ථයට  මුහුණ දෙන්න සිදුවෙනවා. ඒ කියන්නේ ජීවිතයේ යථාර්ථය අවබෝධකර ගැනීමක් අවශ්‍ය වෙනවා. එහෙම නැතිනම් සිදුවන්නේ ජීවිතයේ අපට සිදුවන සිත් කලකිරෙන සිදුවීම් හමුවේ සියල්ල අතහැරදමන අයෙකු වීමයි.  හුගක් මිනිස්සු ජීවිතයේ මුල්කාලේ හුගක් උනන්දුවෙන් යම් යම් දේවල් කරන්න උත්සහ කරනවා. ඉතින් ඒ වගේ එකක් දෙකක් උත්සහයන් අසාර්ථක වුනහම හුගක් අය කරන්නෙ මුළු ජීවිතේම අත ඇරලා දලා මැරිච්ච් අය වගේ ජීවිතය ගෙවන එකයි. ඉතින් ඒ අය මැරෙන්නේ වයස 25 දි විතර.. එත් වල දමන්නේ වයස 75 දී විතර. ජීවිතය තියෙන්නේ එදිනෙදා නඩත්තු කරන්න නොවෙයි. උත්කර්ෂයට නංවන්නයි.

සමහර ප්‍රශ්න විසඳන්නේ කාලයයි... ඒ වගේම සමහරක් ප්‍රහ්න විසඳන්නෙත් අප අපේක්ෂා  කරන විදියටම නොවෙයි...

දෙවන ලෝක යුද්දේ තීරණාත්මක අවස්ථාවක ජපනුන් බුරුමයට කඩාපැන්නා. ඊළඟට ඉන්දියාව. මොකද බ්‍රිතාන්‍යය අධිරාජ්‍යට ආසියාවේ බලය තියගන්න නම් ඉන්දියාව රැකගන්න ඕනී. ජපනා කොයිවෙලාවේ හරි ඉන්දියාවට කඩාපනින්න ඉස්සෙල්ලා සුද්දට ඕන වුනා බුරුමය අල්ලා ගන්න.

ඉතින් බුරුමය අල්ලන මෙහෙයුමට සැළසුම් හදන්න තොරතුරු රැස්කරන්න බ්‍රිතාන්‍ය විශේෂ බළකායේ සෙබළු අටදෙනෙක් රිංගෙව්වා බුරුමේ අතුලට. මේ අය පැය කිහිපයක්ම බුරුමෙ ඇතුළට කැලෑවෙන් ඇවිදගෙන යද්දි නොදැනීම ජපන් ආරක්ෂක ස්ථානගත Defense කිරීමකට ඇවිල්ල. හැබැයි ජපන්නු මේ අට දෙනාව දැක්කේ නෑ මේ පිරිස කුඩා වන ලැහැබක කොටුවෙලා. දැන් මොකද කරන්නෙ?. කොහෙන් පනින්න හැදුවත් වෙඩිකන්න තමයි වෙන්නෙ.

ඉතින් මේ පිරිසෙ නායකයා වෙලා හිටපු කපිතාන්වරයා කළේ එක් හටයෙක් ගහක් උඩ නග්ගලා අවට ජපන්නුන්ගේ ක්‍රියා නිරීක්ෂණය කරන්න කියලා... බඩියට කිච්චලු තේ එකක් දාන්න කියලා. ඒකත් බීලා අනිත් අයට නිසන්සලව ඉන්න කියලා පොඩ්ඩක් නින්දක් (ඇලර්ට්) එකක් දැම්මා. පැය කීපයකම විතර මෙහෙම ඉද්දී ඒ වෙලාවේ ගහ උඩ නිරීක්ෂණ මුරයේ හිටපු කොල්ලා සතුටින් කෑගහනව "සර් ජපන්නු එක පැත්තකින් ගලවගෙන ආපහු යනවා කියලා"

කලබල නොවුන නිසා මේ පිරිසගෙ ජීවිත බේරුණා. අහුවෙන්නත් තිබුණා. එත් ගැලවීයාමට කිසිඳු මඟක් නැති ඒ වෙලාවේ කරන්න තිබුණ හොඳම දේ තමයි ඥානාන්විත කපිතාන්වරයා කළේ. ඉතින් අපිටත් මේ වගේ කිසිඳු විසදුමක් නොපෙනෙන ප්‍රශ්න සමහර වෙලාවට ජීවිතය ලබාදෙනවා. මොකද? මේ වගේ අවස්ථා එන්නේ අපි දන්න ජාති ඔක්කොම් කළාටත් පස්සෙනෙ.

ඒ වගේ වෙලාවට කරන්න ඉතිරිවෙන්නෙ තේ එකක බීලා නිදාගන්න එක විතරමයි. දෛවය ඉතිරි හරිය බලාගනියි. හැබැයි මේ කතාවේ වගේ අපි කැමැති විදියට නොවෙයි සමහර කතාවලදි අපි අකමැති විදියටත් වෙනවා. ඒක තමයි ජීවිතය කියන්නෙ.

කිසිම ගැලවීමක් පෙනෙන තෙක් මානයක නොමැති උභතෝකොටිකයන්ට මුහුණ දීලා ඉන්න වෙලාවලදි කරන්න තියෙන්නෙ එකම දෙයයි. කාලයට බාරදීලා බලන් ඉන්න එකයි. ඒ කියන්නේ අපි දන්න හැමදෙයක්ම කරල විසඳෙන්න නැත්නම් සිත් කලකිරවාගෙන දඟලල තේරුමක් නැහැ. ඒක විශාදය දක්වා වර්ධනය වෙන් පුලුවන්. එහෙම වුනාම හිතෙන්නේ සියදිවි නසා ගන්නමයි. ඒ වෙනුවට අප කළ යුත්තේ දැඩි අධිෂ්ඨානශීලිත්වයකින් සහ ධෛර්යකින් යුතුව තත්වය සුබවාදී අතට හැරේවි යන බලාපොරොත්තුවෙන් පසුවීමයි. කලකිරීමෙන් පසුවීමෙන් නම් කිසිම තේරුමක් නැහැ. මොකද විසඳුමක් තියෙන ප්‍රශ්නයකට කලකිරිලා වැඩක් නෑ වගේම... කිසිම විසඳුමක් නැති ප්‍රශ්නවලටත් කළකිරිලානම් කිසිම පලයක් නැහැ.

ඉදිරි කලාපය හා සම්බන්ධයි...

**ලුතිනන් කර්නල් චන්න කරුණාරත්න රශුප (විශ්‍රාමික)**
**ජීවිත මාර්ගෝපදේශන උපදේශක**



# කවි
# මල් යාය

### සෙබළ බිරිඳ

ඔබයි සැබවින්ම
දිනක් දෙකක් නොව
තිස් වසරක්
අනේක වූ දුක් කම්කටොලු මැද
ලක් ධරණී තලය රැක ගැනීමට
වෙර වීර්ය දුන්නේ
එහි අවසානය රුදුරු ත්‍රස්තයින්
පරාද කොට අප ලැබූ ජයග්‍රහණයයි........
සැබැවින්ම එම ජයග්‍රහණයේ
සැබෑ හිමිකාරිය ඔබයි
එවන් ජයග්‍රහණයක් අප ලැබීමට ඔබෙන් ලද
සහයෝගය වචනයෙන් විස්තර කල නොහැකි තරම්ය
ඔබේ සියළු දෑ පසෙක දා
දයාබර දරු සෙනෙහස තුරුළු කර
මා දිරි ගැන්වීමට ඔබ අප්‍රමාණ මෙහෙයක් කළ බව සත්‍යයි
ඒ මන්ද යත්
සැබැවින්ම ඔබ විරෝධාර රණවිරුවෙකුගේ ආදරණීය
සෙබළ බිරිඳක් නිසාවෙනි

සෙ/23කිහු00166
**කෝප්‍රල් නානායක්කාර එන්කේ**
23ශ්‍රීලංජාආබමු

### සෙනෙහස අපේ

වළාකුළ ඔබ
පවන් රොද මා
ඈත අහසේ
පාවෙනා...

රෝස මලයි නුඹ
දුර උයන් තෙර
තනිව ලෙලදෙනා
සමනලයෙකි මා
ඔබ සිප ගන්නට
නෙහෙකිව ලතවෙන

සුමුදු සඳ ඔබ
පුංචි තරුව මම
ඈත අඳුරු ගුවන් ගැබේ
ලං වන්නට බැරි වෙලා

**කර්නල් එම්ජීඑන්බී මහතුවක්කාර**
**ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී**
**කර්නල් ප්‍රමානි - ශ්‍රීලංයුහසෙව්බමු**

### අම්මා

දස මසක් කුස දරා
අනේක විදි දුක් ගැහැට
විඳිමින්
මා හැදූ මගේ අම්මා

දහසක් සෙනෙහසින්
ආදර වදන් වලින්
ලොවම කියා දුන්
මගේ අම්මා

ලෙඩ ඇඳේ වැතිර ඉද
මරු සමඟ සටන් කර
ජීවිතය ජයගන්න
වෙර දරූ අම්මා

ජීවිතය අනියත බව
පුතේ දැන ගන්න
යයි කියාදෝ
පවසන්න වෙර දරා
අවසන් සුසුම් හෙලූ
රත්තරන් අම්මා

**මේජර් කේකේඑස් කුමාර**
**ශ්‍රීලංජාආබමු**

### රණවිරුවෙකුගේ අවමංගලයයට සහභාගී වූ නිලධාරියෙකුගේ කව

කාකිවර්ණ යුනිෆෝමය පොරවා
කරපටි තරු පදක්කම් පළඳා
අසිපත් අවි දෙඅත්හි රඳවා
පිරිවරා සියක් භටයින් ඉක්මවා

වටකරගෙන ඥාතීන් හිතවතුන්
ඇවිදගත නොහැකි මෑණියන් දෙපසින්
වත්තන් කරන් ඇගේ බාල දියණියන්
සුසාන භූමිය තෙක් ඇදෙයි දේහය පිටුපසින්

වැහිබර අහස පුරා විසිරී ගිය වළාකුළු
නිසල බව බිඳහෙලුවා අවසන් වෙඩි පුපුරු
ඉගිල යයි වැහි ලිහිනුන් ගුවනට බියවූ
බැසයයි මලහිරුත් හිරු අවරට වෙන්වූ

දින ගණනාවක් හඬා වැලපුනු මෑණියන්
අඬනා හඬ නොඇසෙයි ඈ ශෝකයෙන්
නැගුණත් හීන් කෙදිරිය ඇගේ මුවින්
නොඇසුනි නැගණියන් දෙදෙනා නැගූ විලාපයන්

ඔවුන් කුඩාකල මියැඳුනු රෝගී වූ අප්පච්චි
හිඩැස පිරවූ ගෙදර එකම පිරිමි පරානය අයියණ්ඩී
සදහට ඔවුන් තනිකර යයි ආයෙත් නොඑන්නට වෙන්වී
උසුලාගත නොහැකි දරු දුක සිහිවී බිම ඇඳවැටුණී
ඒ මව් සිහිසුන්වී

නැගුණු කඳුලු පිසදාලිය නොහැක මට
අවසන් නොමැත තවමත් මේ පෙරෙට්ටුව
කැරකූ දෙනෙත ඒ මේ අත හොරැහින්
බැලුවෙමි මඟ දෙපස වට පිට රැඳි සෙනඟ

නැත කිසි අයෙක් අවධානය අප දෙසට
දුටුවේ නැත කඳුලු දෙකොපුල් රූරා වැටෙන
නවතාලිය නොහැක වැටෙන කඳුලු කැට
පහත් කලෙමි හීන් සිරුවේ හිස බිමට

**මේජර් ආර්පීආර් ගමගේ ශ්‍රීලංසිරෙ**
**ප්‍රමානි II (ක්‍රියා) - ශ්‍රීලංයුහසෙව්බමු**



ගේය පදරුත්
**විමසුම**



# පුන් සඳ රෑට ඇවිදින්...

පුන් සඳ රෑට ඇවිදින් හේනේ කළුව බිඳ
රන් කෙඳි සේම රන්වන් ඉරිඟු ඉඹිනවද
තුන් යම හීන දැක දැක මොටදැයි ගෙදර ඉඳ
රන්කඳ තාම පැල් රකිනවදෝ නිදි නැතිද

නිල් තරු රෑන ඉඟි බිඟි පාන අහස යට
පිල්කඩ උඩම ඇලවී ඉන්න හිතයි මට
මී අඹ කන්න ගිරවුනි එන්න එපා හෙට
මල් පිපුනාට ගෙඩි නෑ තාම අඹ ගහට

රන් කඳ සේම පින්සර මාගේ ඇතු නිදන
රන්මල් යාන හීනෙන් දකින පින පමණ
තුන්පත් රෑන වේදෝ කොහොම අප දෙදෙන
රන්කැටි පුතුට ඉඩ මදිවාද මගේ යහන

හඬ : නිරෝෂා විරාජිනි

සංගීතය : ඔස්ටින් ප්‍රනාන්දු

පද : රත්න ශ්‍රී විජේසිංහ

විමසුම : ලා/කෝ සුජීව කුමාර කෝවිලතැන්න.

''සඳ'' තරම් කලාකරුවාට නිර්මාණවේෂය දැල්වීමට උත්තේජනය සැපයූ ස්වාභාවික වස්තුවක් නොමැති තරම්ය. සදාකාලිත්වය, වීරත්වය අවිහිංසකත්වය වැනි මානුෂික ගුණාංගද, සම්ප්‍රයෝගය, විප්‍රයෝගය වැනි අති මානුෂික හැඟීම්ද සංජානනය කිරීමට කලාකරුවාට මහඟු මිණක් වුයේ සඳයි. එය අස්පර්ශික මෙන්ම ස්පර්ශික කලා නිර්මාණයන් තුළින් ධ්වනිත වන සත්‍යය වේ. මූර්ති, කැටයම්, සිතුවම් වැනි ස්පර්ෂික කලා මාධ්‍යයන් ඔස්සේ ද, ගීතය, කවිය වැනි අස්පර්ෂික කලා නිර්මාණයන් ඔස්සේද මිනිස් භාවයන් අපූරුවට ප්‍රතිනිර්මාණය කිරීමට සඳ උපමා උපමෙය රූපක ලෙස යොදාගත් අවස්ථාව පෙර අපරදිග කලා නිර්මාණයන් විමර්ශනය කිරීමේදි පෙනී යන කරුණකි. මෙවර ගේය පද විමසුම තුළින් සඳ උපමා, රූපක ලෙස යොදා ගනිමින් මිනිස් භාවයන් අපූරුවට ප්‍රතිනිර්මාණය කළ ගීතයක් ගෙන එන්නෙමු.

ගීතයේ පළමු පෙළම ඖචිත්‍ය ගුණයෙන් මෙන්ම ගේයතා ලකුණින් සාරවත් සංකල්ප රූප මැවීමේ ශක්තියෙන් අනූනය. එම පද පෙළම සවනට වැටෙන කල්හී අප සිත ඈත පිටිසර, හේන් ගොවිතැන තම ජිවිතය කරගත් මිනිසුන් පිරි ප්‍රදේශයක් කරා රැගෙන යන්නේය. එපමණ ද?. නැත. ඒ පිටිසර ගම්මානයේ ගැමි ගෙදරක තනිවී සිටින සුන්දර ලියක් ද අප නෙත් මානයේ දැහන් ගත කරවයි. ඒ කෙසේද යත්, නෙරිය තියා රෙද්ද අඳින වඩා උස් නොවු සැට්ටයකින් දෙතන වසාගත් සුන්දර ගැමි කාන්තාවගේ භාවාත්මක හැඟිම් පිරි වතක් අප ඉදිරියේ සිත්තම් කරවමිනි. ඇය මෙම කතාවේ කතා නායිකාවයි. අවට පරිසරයෙන් විද්‍යාමාන වන්නේ ගණඳුරට ආරෝ කරමින් පුන්සඳ පායා එන වටපිටාවකි. එවන් රාත්‍රියක ඇය ගෙපැලේ තනිවි සිටින්නීය. මක් නිසාද යත් ඇය අවිවාහක ස්ත්‍රියක් හෝ වැන්දඹුවක් නිසාවෙන්ද?. නැත. ඇය විවාහක ස්ත්‍රියකි. නමුත් ඇයගේ වල්ලභයා මේ වන විට ගම්මානයේ ඈත කෙළවර ඉරිඟු හේනක පැල් රකිමින් සිටී.

ඇයට තම වල්ලභයා සිහිවේ. සිතට මොකක්දෝ කිව නොහැකි තරම් පාළුවක් කාංසියක් දැනේ. තම සැමියාගේ පැල් රැකීම යම්තාක් දුරට ඇයට නොරිසි බව අඟවති. පාළු පැලක තනිවී සිටින තරුණ විවාහක කාන්තාවකට එය නොරිසිවීම ඇරමයක් විය නොහැකිය. කිම්ද....? මේ උදාවී අත්තේ පූර්ණ චන්ද්‍රයා පායගෙන චිත් මිනිස් භාවයන් උද්දීපනය කරන සොඳුරුම මනස්කාන්ත රැයකි. එවන් රැයක තම වල්ලභයා තම සමිපයේ තබාගැනීමට ආශා කිරීම අසාධාරණ විය හැකිද?. සැබවින්ම සඳ වුකලී මිනිස් භාවයන් ප්‍රකාශ කිරීමට පමණක් නොව උද්දීපනය කිරීමට ද සමත් අපූරු ගුණයකින් හෙබි විශ්මය ජනක වස්තුවකි. කාමාදි ආශාවන් වඩවාලන ශක්තියක් සඳ තුළ සැඟව ඇතැයි පුරාණ ඍෂිවරුයෝ පවා පවසා තිබේ. විශේෂයෙන් ශෘංගාරාත්මක සිතිවිලි පහළ කිරීමේ අපූරු ගුණයක් සඳ තුළ ඇති බව කියවේ. එවන් මොහොතක රන්වන් පැහැති බඩ ඉරිඟු කෙඳි සිපගෙන ගලන සඳකැන් ඇයට සිහිවේ. එය යම් සංකේතාත්මක රූපයක් විය හැකිය. ඇය පෙර, මැද සහ පසු යාමයේ එසේත් නැතිනම් තුන් යාමයේ යම් සිහිනයක් දකිමින් සිටින බව පැවසේ. ඒ ජාගරාත්මක සිහිනයක්ම ද?. එසේත් නැතිනම් භාවයන් තුළින් ආලෝලනය වූ මානව හැඟීම් අවශ්‍යතාවයක ඉඟි කිරීමක් ද ?. කෙලෙසක වූවත් එය අඹුසැමි මානව සබඳියාව පවත්වා ගැනීමට ඇවසි රාහුල බන්ධනයක ඉඟිකිරීමක් ලෙසද අර්ථ විවරණය කළ හැකිය? (එය ඉදිරියේ දී විසඳාගත හැකිය) කරුණු කාරණ කෙසේ වූවත් ඇය පෙම්බර බිරිඳක් බවනම් පැවසිය යුතුය. ඇය සියල්ල විඳදරාගෙන තම සැමියා ආමන්ත්‍රණය කරන ආකාරය කොතරම් අනුවේදනීය ද? ''රන්කඳ තාම පැල් රකිනවදෝ නිදි නැති ද?'' විවාහ දිවියේ රස පහස විඳගැනීමට ඇවසිම මොහොතක ඔහු තමා සමිපයේ නොමැති වූවත් ඒ පිළිබඳ ඇයට ආරෝවක් නොමැති බව පෙනේ. ගීපද රචකයා අප තුළ මවන්නාවූ චිත්ත රූපාවලිය අප මනසට කොතරම් බරද?.

**නිල් තරු රෑන ඉඟි බිඟි පාන අහස යට**
**පිල්කඩ උඩම ඇලවී ඉන්න හිතයි මට**
**මී අඹ කන්න ගිරවුනි එන්න එපා හෙට**
**මල් පිපුනාට ගෙඩි නෑ තාම අඹ ගහට**

සඳකැන් ගලා හැලෙන ඒ සෞම්‍ය රාත්‍රියේ ඇයට පිල්කඩ උඩම ඇලවී ඉන්න ආශාවක් අතිව තිබේ. පිල වූ කලී වඩා උස්නොවු බිත්තියකින් වටකළ ගැමි ගෙදරක ඉදිරිපස කොටසට කියන නාමයයි. එයට ස්තෝප්පුව යැයිද වහරන අවස්ථා ද තිබේ. එහි ඇති මැටියෙන් තැනූ වේදිකාවට පිල්කඩ යැයි කියති. මෙම මැටි වේදිකාව වාඩිවීමට ද, නිදා ගැනිමට සයනයක් ලෙස ද භාවිතා කරන අවස්ථා ඇත. විශේෂයෙන් දරුමල්ලන් ලොකු මහත් වූ පසු ගෘහපතියා බොහෝ විට රාත්‍රිය පහන් කිරීමට ද පිල්කඩ යොදාගත්තේය. ඒ මිට දශක තුන හතරකට පෙරැතුවය. නිවසට යන එන අමුත්තන් හා මෙන්ම පවුලේ සමාජිකයන්ද විවේක පාඩුවේ




ඉන්නා විට අල්ලාප සල්ලාපයේ යෙදෙන්නේ ද පිල්කඩේම වාඩිලාගෙනමය. කරුණු කාරණා එසේ වේනම් ? සඳ ඇති රයක නැඹුලේ පැල් ගැහුණු ගැටයෙකු හා ගැටිස්සියකට පිල්කඩෙහි වාඩිවී ආලකතා කීමට රුචියක් ඇතිවීම අහේතුක කාල ප්‍රතික්‍රියාවක් පැවසීම කාට නම් කළ හැක්කක් ද?. ඒ නිසා ඇයට ද නිල් තරුකැට පිරුණු රාත්‍රියේ පිල්කඩේ වැතිර සිටීමට ආශාවක් ඇති බව පැවසේ. ''නිල් තරු රැන ඉඟි බිඟි පාන අහස යට'' නීල වර්ණ තරු රැන ඇයගේ හිතට කුමක්දෝ ආශ්වාද ජනක සිතිවිලි රැගෙන විත් ඇති සැටියකි. මෙයද අපූරු උපමාවකි. සාහිත්‍යයේ හැරුණු කොට කහ පැහයෙන් දිදුලන තාරකාවන් නීල වර්ණයෙන් යුක්ත යැයි පැවසීම කාටනම් කළ හැකිද?. සැබවින්ම අප දෙනෙත් නීල වර්ණයෙන් යුක්ත බව සාහිත්‍යය පරිශීලනයේ අපට නිබඳව ඇස ගැටෙන උපමාවකි. ඇය තම සැමියාගේ අනුරාගී දෙනෙත් ඒ නිල් වර්ණ තරුකැට තුළින් නොදුටුවේ යැයි කාටනම් පැවසිය හැකි ද?. සොබා දහම විසින් ඇයට තම ප්‍රේමනීය සැමියාගේ දෙනෙත්වල රස පහස හා විඳීමට අවස්ථාව උදාකර දී තිබේ. එයට කාහටනම් එරෙහි විය හැකිද?

ගීපද රචකයා මවන සංකල්පමය රූපය කොතරම් ප්‍රබල වීද?. එහෙත් ''මී අඹ කන්න ගිරවුනි එන්න එපා හෙට'' ඇය ව්‍යාංගාර්ථයෙන් යමක් කියන්නේය. ඒ කුමක් විය හැකිද?. මී අඹ වූ කලී වෙනත් අඹ පල හා බලන කළ ඉතා ඉමිහිරි රසයෙන් යුක්කත අඹ විශේෂයකි. එහ එලයන් අන් අඹ වලට වඩා කුඩාය. එහෙත් රසයෙන් අන් අඹ සැම පරදවන්නේය. ඒ රසයට ලොබ බඳින්නේ මිනිසුන් පමණක් නොවන්නේය. කුරුලු කොබොයියෝද, ලේනුන් වැනි ක්ෂීරපායි සත්තුද මී අඹ කෑමට රුචියක් දක්වති. විශේෂයෙන් ගිරවු ද මෙයට මහත් කැඳර කමක් දක්වන්නේය. එහෙත් ඇය කියන්නේ මේ රාත්‍රියේ මී අඹ කන්න ගිරවුන් ගේ පැමිණීම අනවශ්‍ය බවකි. සඳ ඇති රයක ගිරවුන් පළවැල සොයා යැමක් සිදුවේද?. මෙහිදි අපට ඉතා ජනප්‍රිය පැල් කවියක් සිහියට නැගේ.

**අනේ දෙවියනේ මට වුන වියෝයා**
**පැලේ පැදුර හොරු අරගෙන ගියෝයා**
**ගෙදර ගිය කලට අඬ දබර බෝයා**
**පැදුර දුන් කෙනෙක් මගේ නෑ සියෝයා.**

අප කතානායකයා නිවසේ තිබූ පැදුරත් රැගෙන පැලට ගොස් ඇත. පැදුර කුමක් සඳහාද?. නිදියා ගැනීමට ද?. නැත. පැල් කවි කියමින් වන සතුන් ගෙන් වගාව ආරක්ෂා කරගැනීමට මැස්සේ එලාගෙන වඩාවී සිටීමටය. එසේ ගිය ගැමියාගේ පැදුර කවුරුන් හෝ රැගෙන ගොස් තිබේ. මහත් අකරතැබ්බයකි. නිවසට ගිය කළ බිරින්දෑ පැදුර ගැන විමසන්නේය. දීමට පිළිතුරක් නැත. සිදුවන්නේ අඬදබර වීම පමණි. එසේ නම් ගැමියා මැස්සේ පැදුර එළා තබා හොර රහසේ ගිය ගමන ගැන අපට යමක් සිතන්නට සිදුවේ. වචන දහසකින් පැවසිය යුතු කතන්දරය ගැමියා අපූරුවට පද හතරක් ඔස්සේ ව්‍යාංගාර්ථයෙන් පවසා තිබීම විශ්මය ජනකය.

මෙහිදී ද එවැන්නක් සිදුව ඇතැයි අපට නිශ්චිතව පැවසීම කළ නොහැකි වූවත්, යම් ආසන්න තීරණ දෙකකට එළඹිය හැකිය. එනම් අර පෙර සඳහන් කළ කවියේ උන් ගැමියා සේ ගැමියෙක් තනිපංගලමේ සිටින ඇයගේ පැලට ගොඩවේද?. එසේත් නැතිනම් පැල් රැකීම අතහැර සඳ ඇති මෙවන් සැම රයකම තම වල්ලභයා පිල්කඩ උඩට පැමිණෙන්නේද?. කෙසේ වූවත් එම පද පෙළේ උපරිම ව්‍යාංගාර්ථය දනවනු ලබන්නේ ''මල් පිපුණාට ගෙඩි නෑ තාම අඹ ගහට'' යන පද පෙළ ගැස්මයි. ලෝකයේ ලොකු කුඩා සැම ප්‍රාණියෙකුටම ප්‍රජනනය සඳහා ඍතු පහළ වීම ස්වභාවික සංසිද්ධියකි. මානවයාටද මෙය පොදු ධර්මතාවකි. ජීව විද්‍යාත්මකව බැලූ කළද ඍතු පහළ වීමට පෙර ස්ත්‍රී ශරීරයේ යම් යම් හෝමෝන විපර්යාසයන් සිදුවේ. ඒ කාලය තුළ සංවාසය නොතරම්ය. මෙයත් ඒවැනි අකරතැබ්බයක් පිළිබඳ ඉඟි කිරීමක් ද?. එසේත් නැතිනම් ඍතු පහළවී කලක් ගියත් තමා පල හට ගැනීම



පිළිබඳ හාංකවිසියක් ඉඟියක් නොමැති බව පැවසීමක්ද?. ගී පද රචකයා අපව අතරමං කර ඇති සැටියකි.

**රන් කඳ සේම පින්සර මාගෙ ඇතු නිදන**
**රන්මල් යාන හීනෙන් දකින පින පමණ**
**තුන්පත් රැන චේදෝ කොහොම අප දෙදෙන**
**රන්කැටි පුතුට ඉඩ මදිවාද මගේ යහන**

ගැමි බිරින්දෑ සැමියාට දක්වන්නේ අපමණ වූ සෙනෙහසකි. ඒ නිසාම ඇයට ඔහු හස්තියෙක් බඳුය. ඔහුගේ කාය ශක්තිය, මෙන්ම ආත්ම ශක්තිය ඇයද ජීවත් කරවන්නේය. එබැවින් ඇයට තම සැමියා ඡද්දන්ත කුලයේ ඇතෙකු සරිලන්නේය. ඡද්දන්ත කුලයේ ඇතෙකු කියා මෙහි නොතිබුණත් එයද පාඨක දැනුම ප්‍රසාරණයට ඉවහල් වේ යැයි සිතෙන බැවින් සටහන් කරමි. ඡද්දන්ත කුලයේ ඇතෙකුගේ බාහිර අංගෝපාංග සතක් මහ පොළව ස්පර්ශ කළ යුතු බව පැවසේ. එනම් සොඬ, ලිංගේන්ද්‍රය, වලිගය, යන ශරීර අවයව තුන හා සිව්පා යන සතරය. ඒ ශරීරාංග මිහිකත ස්පර්ශ කරයි නම් ඒ ඡද්දන්ත කුලයේ නොහොත් සද්ධන්ත කුලයේ ඇතෙකු බව පැවසේ. කෙසේ හෝ ගැමි බිරිඳගේ ස්වාමි භක්තිය කොතරම්දැයි ''රන් කඳ සේම පින්සර මාගෙ ඇතු නිදන'' පද වැල තුලින් අපට පසක් කරගත හැකිය. රන් කඳ, පින්සාර, මගේ ඇතු වැනි වදන් තුළින් මැවෙන්නා වූ ස්වාමි භක්තිය කොතරම්ද?. ''රන්මල් යාන හීනෙන් දකින පින පමණ'' මෙයද අපූරු පද එකතුවකි. ගම්මානය ඇත කෙළවරේ හේනේ තනා ඇති දඬු මැස්ස ඇය සිහිනෙන් දකින්නේය. ඒ කෙසේද යත් රන්මල් ඇතිරූ යහනක් ලෙසිනි. ඒ රන්වන් යහනේ තම සැමියා වැතිරී සිටින අයුරු ඇය දකින්නේය. එහෙත් ඇයට ඒ රන්වන් මලින් සැදි යහනේ සැතපීමට හැකි වන්නේ සිහිනයෙන් පමණි. මන්ද අලි කොටි වග වලසුන් පිරි මහ කැලයේ තම ප්‍රියාවිය රැගෙන යෑමට ඔහු මැලිකමක් දක්වනවා විය හැකිය. ඒ ඇයගේ ආරක්ෂාව ගැන සිතා විය යුතුය.

**තුන්පත් රැන චේදෝ කොහොම අප දෙදෙන**
**රන්කැටි පුතුට ඉඩ මදිවාද මගේ යහන**

''තුන්පත් රැන චේදෝ කොහොම අප දෙදෙන'' මෙය අපූරු රූපක මැවිල්ලකි. සැබැවින්ම තුන්පත් රැනට අයිතිවන්නේ මව පැටියා හා තවත් ඇත්තින්නියක බව පොතපතේ සඳහන් වූවත් ගේයපද රචකයා මෙමඟින් අඹුසැමි ලෝකය විෂයේ අති ප්‍රබල බන්ධනයක් වූ දූදරු සම්බන්ධය සංකේතවත් කර තිබේ. අප කතානායිකාවට බලාපොරොත්තුවක්, ප්‍රාර්ථනයක් ඇත. ඒ දෙන්නා තුන්දෙනා වන සිහිනයයි. එහෙත් ඇයට කකුසක් ද තිබෙන බව පෙනේ. ඒ නිසාම ඇය පැනයක් නගයි '' රන්කැටි පුතුට ඉඩ මදිවාද මගෙ යහන'' මෙම ගීතයේ කූටප්‍රාප්තිය එයයි. අපූරු උපමා රූපක භාවිතා කරමින් ලියා ඇති මෙම ගීතය තුළින් දරුපල අහිමි කාන්තාවකගේ මනෝභවය අපූරුවට විචිත්‍රණය කර ඇති අයුරු ප්‍රශංසනිය වේ. එලෙස ඇය පිළිබඳව අප සිත් තුළ ජනිතවන අනුකම්පා සහගත හැඟීම් කොපමනද?. බොහෝ විට දරුපල අහිමි කාන්තාවන් කොන් කරන සමාජ ක්‍රමයක් තුළ ගීපද රචකයා ඇය වෙත හෙළා ඇති මානුෂිය දෘෂ්ටිය කොතරම් අගනේද?.

මෙහි පද රචකයාණන් වන්නේ ප්‍රවීන කවියෙකු මෙන්ම ගේය පද රචකයෙකු වන රත්න ශ්‍රී විජේසිංහ යන් වේ. ඔහුගේ සෑම ගීතයක් පිටුපසම අපූරු කතන්දරයක් තිබේ. ගීත තරමටම ඒ කතන්දරද අපූරුය. ඔහුගේ නිර්මාණ වපසරිය විවිධ සමාජ තළ ඔස්සේ පෝෂණය වුවකි. එය මහමන්දීරයේ සිට අතු පැල දක්වාම, නූතන තාරුණ්‍යයේ සිට මහල්ලා දක්වාද, ඇත පිටිසර බඳ ගම්මානයේ සිට කෙළඹ හත දක්වාද පුළුල් වපසරියක් පුරා පැතිර තිබේ. ඔහුගේ සෑම ගීතයකම, කවියකම පුද්ගලික හෝ සමාජ අත්දැකීම් ගැබ්ව ඇත. එවන් නිර්මාණ රාශියක් සඳහා උදාහරණ ඇති මුත් මෙම ගීතයට වස්තු විෂය නොහොත් අනුභූතිය ලැබූ අයුරු පමණක් ලියා තැබීම වටී. කලක් රාජ්‍ය සේවයේ යෙදී සිටි ඔහු දිනක් රාජකාරිමය කටයුත්තක් සඳහා අනුරාධපුර ප්‍රදේශයට ගොස් තිබේ. වියළි රජරට අති දුෂ්කර ප්‍රදේශයකට ගිය ඔහුට සොඳුරු මිත්තණියක හමුව ඇත. තරුණ විය රූප සොබාවෙන් පිරිපුන්ව සිටි බවට තවමත් ශේෂගත ලක්ෂණ ඇගේ වතේ සැඟවී තිබුණි. එහෙත් ඇය විසූ ගෘහයේ වෙනත් කිසිවෙකු නොවීය. තොරතුරු සොයා යෑමේදී සැමියා මියගොස් තිබුණේය. දරුවෙකු, මුණුපුරෙකු මිණිපිරියක් දක්නට ද සිටියේ නැත. එසේ සිටි ලකුණකුදු දක්නට නොවිණි. ඇගේ කල වයස විමසන කල්හි ඇයට දරු මුණුපුරුන් නොසිටීමට විදියක් ද නැත. මන්ද එකල පුංචි පවුල රත්තරන් නොවූ නිසාවෙනි. එකල එක පවුලක අවම වශයෙන් දරුමල්ලන් හත් අට දෙනෙකු නොසිටිය හොත් පුදුමයකි. විශේෂයෙන් රජරට වැනි උෂ්ණාධික පරිසරයක, බත බුලතින් පෝෂණය වූ ප්‍රදේශයකට මෙම කාරණය සැබවින්ම අහුඹුවක්ම විය. අප ගේපද රචකයා මේ ගැන ඇයගෙන් විමසූ විට ඈ ලබාදී ඇත්තේ අපූරු උත්තරයකි.

''අනේ පුතේ ඒකාලේ අපේ උන්දැට ඒවයේ වුවමනාවක් තිබුණේ නැතිකොට. තුන් තිස් පැයේම උන්දැගේ ජීවිතේ උනේ හේනයි කුඹුරයි. මහ රාත්තිරිය පවා උන්දෑ කලේ පැල් ලැගපු එක නොවැ. ඉතින් මම කියලා මක්කා කොරන්නද?...''

ඇයගේ එම පිළිතුරු ඔහුගේ නිර්මාණවේෂය දල්වා ඇති අපූරුව කොතරම්ද ?. නිර්මාණකරුවා වූ කළී අපූරු දේ මවන්නෙකි. එමඟින් තමා ආමන්ත්‍රණය කරන ප්‍රජාව කම්පනයට පත්කරනේය. එයින්නුත් නොනවැති ආනන්දයෙන් ප්‍රඥාවකරා රැගෙන යන්නේ. තමාගේ අත්දැකීම පොදු අත්දැකීමක් බවට පත්කරන්නේය. එය කළ හැක්කේ ප්‍රතිභා ශක්තියෙන් අනූන ඇසූ පිරූ තැන් ඇති නිර්මාණකරුවෙකුට පමණි. රත්න ශ්‍රී විජේසිංහයන් අයත්වන්නේ එම ගොන්නටය.



## ඒකක තතු සොයා

# වන්නියට











වන්නි ආරක්‍ෂක සේනා මුලස්ථානය යටතේ පාලනය වන සියලු ස්වේච්ඡා ඒකකයන්හි රාජකාරි කටයුතු පිලිබඳ සොයාබැලීමේ අරමුණින් සිදු කෙරුණු පාලන පරික්‍ෂාවක් ඉකුත් දෙසැම්බර් මස දී සිදු කෙරිණ. ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් එල්එෆ් කස්තුරිආරච්චි ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණු එම පාලන පරික්‍ෂාවට ස්වේච්ඡා බලසේනාවේ සියලු අංශ ආයතන නියෝජනය කරමින් නිලධාරින් හා සෙසු නිලයින්ගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩලයක් ද සහභාගී වූහ. අදාළ ස්වේච්ඡා ඒකක වලට සිය රාජකාරින් ඉටුකිරීමේදී බලපාන ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීමටත් ස්වේච්ඡා බලසේනාවේ ඉදිරි ක්‍රියාමාර්ග හා සැලසුම් පිලිබඳ එම ඒකක දැනුවත් කිරිමත් මෙම පාලන පරික්‍ෂාවේ අරමුණයි. මෙම කටයුත්ත ස්වේච්ඡා බලසේනාවේ වාර්ෂික සැලැස්මට අනුව සිදු කරන්නක් වන අතර මේ අයුරින්ම ඒ ඒ ආරක්‍ෂක සේනා මුලස්ථාන යටතේ පාලනය වන සෙසු ස්වේච්ඡා ඒකක වල පාලන ගැටලු වලට විසඳුම් ලබා දීමටද නියමිතය.

# ඒකක
# විත්ති...



## 15 ශ්‍රීලංජාආබමු

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී එම තනතුරෙන් නික්මයාමට පෙර යාපනය අර්ධද්වීපයේ ඇති ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තුවට අයත් ඒකකයන්හි සංචාරයක නිරත විය. එහිදී කෝපායි හි ස්ථානගත 15 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවෙහි නිරීක්ෂණ කටයුතු අතරතුර...



## 10 (සෙව්) විපාරෙ

ආරක්ෂක සේනා මූලස්ථාන (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඩීයූකේ හෙට්ටිආරච්චි ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී පසුගියදා මරදන්කේනි ප්‍රදේශයේ ස්ථානගත 10(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිල සංචාරයක නිරත විය. මෙහිදි ඒකකයේ වත්මන් රජකාරි මෙන්ම පාලන තත්ත්වය විමසා බැලූ ආසේමු (යා) අඥාපති සියලු නිල දිවාභෝජන සංග්‍රහයකටද සහභාගි විය.





## 26 ශ්‍රීලංජාආබමු

විඩත්තපලෙයි කොඩිකාමම් ප්‍රදේශයේ ස්ථානගත 26 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු වෙත 2017.11.26 වන දින ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එම නිරීක්ෂණ චාරිකාවට සමගාමීව එම ඒකකයේ ඉදිකළ නව නිලධාරි නිවස්නය විවෘත කිරීමද රෙජිමේන්තු අධිපතිගේ සුරතින් සිදුවිය.



## 22 ශ්‍රීලංජාආබමු

ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඩීයූකේ හෙට්ටිආරච්චි ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී පසුගියදා යාපනය වල්ලේයි ප්‍රදේශයේ ස්ථානගත 22 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය.



## 10 (සෙව්) විපාරෙ

විජයබාහු පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒ කාරියකරවන යූඑස්පී එන්ඩීසී ඉකුත් දා යාපනය මරදන්කේනි ප්‍රදේශයේ ස්ථාන ගත 10(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවේ සංචාරයක නිරතවිය. එහිදී ඒකකයේ පාලන කටයුතු පිළිබඳ සොයා බැලූ ඉහතෙම සියළු හට පිරිස් ඇමතීමටද අමතක නොකළේය.

# ඒකක විත්ති...



## 9 (සෙව්) ශ්‍රීලපාහ

14 සේනාංකයේ කර්නල් සම්බන්ධීකරණ නිලධාරි (සෙව් කටයුතු) කර්නල් සීඑම්එස්ජේ සිල්වා පසුගියදා කැලණිමුල්ල ප්‍රදේශයේ ස්ථානගත 9 (සෙව්) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා කඳවුරේ සංචාරයක නිරත විය.



## 14 (සෙව්) ගැමුණු හේවා බළකාය

14 (සෙව්) ගැමුණු හේවා බළකාය සිය 21වන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරි ඒඑස් කණ්ඩම්බි ගැහේබ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් සමරන ලදි.

රණවරුණ 24 කලාපයේ පලවූ 9 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ කඳවුරු සංචාරයකට අදාළ ඡායාරූපයක් 14 සේනාංකාධිපති ලෙස මේජර් ජෙනරාල් ආර්ජ් නුගේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ලෙස වැරදීමකින් සඳහන්ව ඇත. ඒ පිළිබඳ අපගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරන අතර, එය මෙවර කලාපයේ නිවැරදි කොට පළකරන බව කාරුණිකව දන්වා සිටිමී.



## 13 ශ්‍රිලංජාආබමු

2017 අගෝස්තු 07 වන දින සිට දෙසැම්බර් 29 වන දින දක්වා පවත්වනු ලැබූ 62 වන විශේෂ පාබල ක්‍රියාන්විත (SIO) පුහුණු පාඨමාලාව සාර්ථකව හැදෑරූ 13 ශ්‍රිලංජාආබමු භට පිරිස සිය ඒකක අණදෙන නිළධාරී සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු...



## 15 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

15 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සිය 21වන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරි මේජර් එම්එම්ඩීජේඑස්කේ විජයරත්නගේ ශ්‍රීලංසිරෙ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් තගිලමාවිල් කඳවුරේදි සමරන ලදි.



## කඳවුරු සංචාරයක

14 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ඒඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී පසුගියදා කොළඹ කැලණිමුල්ල ප්‍රදේශයේ ස්ථානගත 9 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. මෙහිදී ඒකක අණදෙන නිලධාරි මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී විසින් සේනාංකාධිපති පිළිගන්නා ලදී.

## සුභ මොහොතින්
# නව තනතුරු ලැබ



ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා
බළසේනා මූලස්ථාන
පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර්
එච්පීජේ මායාදුන්නේ ආර්එස්පී



ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා
බළසේනා මූලස්ථාන
බ්‍රිගේඩියර් හකාස
බ්‍රිගේඩියර් පීජ් කලුආරච්චි



54 සේනාංක කර්නල්
සම්බන්ධීකරන නිලධාරී (සෙව්)
කර්නල් එම්ටීකේආර් සිල්වා



10 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක
බලමුළු වැ.බ.අණදෙන නිළධාරී
මේජර් එච්පීටී කුමාරසිරි
ශ්‍රීලංජාආබමු



5(සෙව්) ශ්‍රී ලංකා පොදු සේවා
බලකා වැ.බ.අණදෙන නිළධාරී
මේජර් ආර්එම්එස් ජයන්ත
ශ්‍රීලයුපොදුසේබ




3(සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා
කාන්තා බලකායේ වැ.බ.
අණදෙන නිලධාරිණී
මේජර් සී විජේතිලක ශ්‍රීලයුකාබ



15 (සෙව්) ශ්‍රී ලංකා සිංහ
රෙජිමේන්තු සැරයන් මේජර්
බළලත් නිලධාරි I
ඩබ්ලිව්ජීඑස් බණ්ඩාර

## විරු කැකුළු
# හපන්කම්




**කේ. බී. පසිඳු හිරාන් විජේවීර**
**5 ශ්‍රේණිය**
**ර/උඩුමත්ත මිහිඳු මහා විද්‍යාලය**



**එස්. එම්. ඒ. වෙනුදි ශේෂාලි ගුණවර්ධන**
**විශාඛා පෙරපාසල**
**හංවැල්ල.**



**වී.පී.ජී. විතුලි නෙවනයා**
**3 ශ්‍රේණිය**
**සිද්ධාර්ථ මහා විද්‍යාලය, තලපත්පිටිය**



**එන් එම් විදුත් විමුක්ති මුනිප්‍රිය**
**6 ශ්‍රේණිය**
**ර/ දිවුරුම්පිටිය සමන් විද්‍යාලය**



විවිධ
# පුවත්



## 15 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

යාපනය ප්‍රදේශයේ ස්ථානගත 15 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව සිය බළඇණි පුහුණුව පසුගියදා 51 වන සේනාංක බළඇණි පුහුණු පාසල වාසවිලාන් වෙතින් සාර්ථකව හදාරන ලදී. නිළධාරින් 07 ක් හා සෙසුනිළයින් 226 ක් සහභාගි වු මෙම පාඨමාලාවේ අවසන් දේශනය 511 බළසේනාවේ බළසේනාධිපති විසින් සිදුකරන ලදී.



## ආසේමු (නැ)

සොබාදහමට මුල්තැනක් දෙමින් හා එයට ගෞරව කිරීමේ අරමුණින් පැවත්වෙන තෛපොන්ගල් සැමරුම් උත්සවය මෙවරත් අති උත්කර්ෂවත් අන්දමින් පැවත්වීමට මෙරට හින්දු ජනතාව කටයුතු කර තිබිණි. ඒ අනුව සහජීවනය අගයන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මෙවර ද ඒ සඳහා දායක විය.

නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරල් සන්තුසිත පනන්වල ගේ උපදෙස් මත ආසේමු(නැ) මුලස්ථානය විසින් මාමංග පිල්ලෙයාර් කොවිලේ දි තෛපොංගල් සැමැරුම් උත්සවයක් පැවැත් වූ අතර, ඒ සඳහා විශාල සිවිල් වැසියෝ පිරිසක් එකතු වී සිටියහ. සාම්ප්‍රදායික හින්දු ආගමික වතාවත් පැවැත් වූ ස්වාමි සුන්දර් නායගම් විසින් සිදුකල අතර, එහිදි එතුමන් ආඥාපතිතුමන් ඇතුළු පැමිණ සිටි සියළු දෙනා හට සෙත්පතා ආශිර්වාද කිරීමට ද අමතක නොකළේය.



## 16(සෙව්) ගැමුණු හේවා බළඇණිය

බළඇණි පුහුණු පාසල කටුකැලියාව වෙතින් පුහුණුව ලබමින් සිටින 16(සෙව්)ගැමුණු හේවා බළඇණියට අයත් භට පිරිස් සිය පාඨමාලාව අතරතුර පසුගියදා මඩුදේවස්ථානය සහ ඓතිහාසික සෝමාවතී චෛත්‍ය වන්දනාමාන කිරීම සඳහා සහභාගී වුහ.



## 19 ශ්‍රීලංජාආබමු

ලෝකවාසි ජනයාගේ ඉමහත් භක්තියට පාත්‍ර වූ ශ්‍රීපාදස්ථාන වන්දනා සමය පසුගියදා ඇරඹුණු අතර, මෙවරද ඒ සඳහා දෙස් විදෙස් බැතිමතුන් විශාල පිරිසක් සහභාගී වෙමින් සිටින අයුරු දැකගන්නට පිළිවන. එහෙත් පසුගියදා අනපේක්ෂිත ලෙස ඔවුන්ගේ ගමන් මඟ ඇහිරී ගියේය. ඒ සමනල කන්ද මස්තකයේ පිහිටි කුණු කන්දක් කඩාවැටීම හේතුවෙනි. මෙය දැනගත් වහාම ක්‍රියාත්මක වූ ස්වේච්ඡා බළසේනාවට අයත් ලක්ෂපාන ප්‍රදේශයේ ස්ථානගත 19 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු භට පිරිස් හා නුවරඑළිය ප්‍රදේශයේ ස්ථානගත 3(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු භට පිරිස් එකතුවී දින තුනක ඇවෑමෙන් නැවත ගමන් මාර්ගය මහත් පරිශ්‍රමයක් දරා යථාතත්වයට පත් කරන ලදී.

19 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් නිලධාරියෙක් හා සෙබළුන් 20 ක්ද, 3(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් සෙබළළු 20ක් මේ සඳහා ශ්‍රමදායකත්වය ලබාදුන්හ.

ජනසෙත

# සදමින්



ආසේමු (කිලි) ආඥාපතිගේ සංකල්පයකට අනුව 57 වන සේනාංකයේ සේනාංකාධිපති ගේ සහ 571 බළසේනාවේ බළසේනාධිපතිගේ උපදෙස් මත 2018.01.02 දින තිරුවයියාරු (බටහිර) ග්‍රාම නිලධාරී වසමේ පිහිටි එස්. කේ. අරුවුච්චෝලෙයි ළමා නිවාසයේ ළමුන් 43ක් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පවත්වා, සංගීතමය වැඩසටහනක් මෙන්ම ත්‍යාග ප්‍රදානයක් ද සිදුකරන ලදී. 16 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා වැ.බ. අණදෙන නිලධාරී මේජර් යුආර්එල් පෙරේරා ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය යටතේ එම උත්සවය සිදුකෙරිණ.

මෙම අවස්ථාවට ආසේමු (කිලි) ආඥාපති මේජර් ජෙනරල් අජිත් කාරියකරවන යූඑස්පී එන්ඩීසී සහභාගී විය. තවද 57 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී 571 බළසේනාවේ බළසේනාධිපති කර්නල් කේටීපීඩීඑස් කොළඹතන්තිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ද මෙම අවස්ථාවට එක්වූහ.



අම්බන්නාවේලි, කොමතලාමඩු ප්‍රදේශයේ සිවිල් වැසියන්ගේ ජන ජීවිතය නංවාලීමේ අරමුණින් ඔවුන් වෙත පොල් පැළ බෙදාදීමෙ මාහැගි කටයුත්තක් ඉකුත්දා සිදුකෙරිණ. මඩකලපුව පොල් සංවර්ධන මණ්ඩලයේ දායකත්වය ඇතිව සංවිධානය කෙරුණ එම කටයුත්තට 233 බළසේනාවේ බළසේනාධිපති ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූ අතර එහිදී පොල් පැල 1500ක ප්‍රමාණයක් බෙදාදීමට කටයුතු කරන ලදී.



මහනුවර ප්‍රදේශයේ ස්ථානගත 2(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඒඑම්ඩබ්ලිව්පී අබේසේකර ශ්‍රීලංසිරෙ ගේ හා දෙවන අණදෙන නිලධාරි ගේ උදාර සංකල්පයකට අනුව ඔවුන් දෙදෙනාගේ සමීපතම කලණ මිතුරන්ගේ නොමසුරු ආධාරයෙන් එම ඒකක සමාජිතයින්ගේ පාසල් යන දූදරුවන් වෙත අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීමක් 2017.12.17 වන දින සිදුකරන ලදී.



ගෙවීගිය 2017 නත්තල් උත්සවයට සමගාමීව 24 ශ්‍රීලංකා ජාතික ආරක්ෂක බලමුළු වැ.බ. අණදෙන නිලධාරි මේජර් එම්එස්පී මාරසිංහ ගේ මඟපෙන්වීම මත පච්චනූර් ගම්මානයේ කතෝලික පල්ලිය හා සම්බන්ධතාවයෙන් ප්‍රදේශයේ 2018 වසර සඳහා පාසල් වෙත ඇතුළත් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින දූවා දරුවන් වෙත තිළින ප්‍රදානයක් පසුගියදා සිදුකරන ලදී.

# 25 වසරක මිතුරුකමේ මතක එකමුතුව (1992- 2017 රිදී ජුබිලිය)








ස්වේච්ඡා පාඨමාල අංක 17 ට අයත් නිලධාරින්ගේ 25 වන වාර්ෂික සුහද එකමුතුව ඉකුත් දෙසැම්බර් 19 දින යක්කල රණවිරු ඇපරල් කඳවුරෙහි පිහිණුම් තාටාක පරිශ්‍රයේදී පැවැත්විණ. එම නිලධාරින්ගේ බිරින්ඳවරුන් හා දූ දරුවන්ගේද සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු එම අවස්ථාවට ස්වේච්ඡා පාඨමාලා අංක 17 ට අයත් පාඨමාලා භාර නිලධාරින් ද එක්ව සිටීම විශේෂත්වයකි. රට වෙනුවෙන් තම තුරුණු දිවි කැපකළ එම පාඨමාලවට අයත් නිලධාරින් 07 දෙනෙකු සමරා සිදුකළ ආගමික වතාවත් වලට එහිදී මුල්තැනක් හිමිවිය. තවද බිරින්ඳවරුන් හා දූ දරුවන් වෙනුවෙන් පැවැත්වූ විශේෂාංග රාශියක් ද එදින උත්සව කටයුතු අතරට එක්ව තිබූ අතර, 25 වන සැමරුම නිමිත්තෙන් විශේෂ සමරු කලාපයක් ද එළිදක්වන ලදී. විවිධ කෙෂ්ත්‍රයන්හි විශේෂ දක්ෂතා සපිරි නිලධාරින් රැසකගෙන් සැදි ස්වේච්ඡා පාඨමාලා අංක 17 සිය එකමුතුකම හරහා වාර්ෂිකව සිදුකරන මෙම කටයුත්ත මගින් සෙසු ස්වේච්ඡා පාඨමාලාවලටද සපයා ඇත්තේ කදිම ආදර්ශයකි. සැබැවින්ම එය වූ කලී 25 වසරක මිතුරුකමේ මතක අලුත් කළ සුන්දර මොහොතකි.

# සැබෑ වූ සිහිනයේ සුන්දර මතකය



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
16 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත්
සෙ/16එච්00533
**ලා/කෝ පුෂ්ප කුමාර කේඩීඩී හා ඒ. හංෂිකා නදීශානි මෙනවිය.**



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
11 වන ශ්‍රීලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත්
නි/10249
**ලුතිතන් එල්ඒ්ර් පීරිස් ශ්‍රිලංජාආබමු හා කේඑම් සයනි හංසමාලි ගුණසේකර මෙනවිය**

# රෙජිමේන්තු සම්බන්ධීකරන නිළධාරීන් දැනුවත් කරමින්...



ස්වේච්ඡා බළසේනාවට අයත් රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරීන්ගේ සාකච්ඡාවක් ඉකුත් ජනවාරි 12 වෙනි දින ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් එම මුලස්ථානයේ දී පැවැත්විණ. 2018 වසරේ වාර්ෂික සැලැස්මට අනුව සංවිධානය කෙරුණු ප්‍රථම සාකච්ඡාව එය වූ අතර, එම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක, මූලික මාණ්ඩලික නිලධාරි ඇතුලු ස්වේච්ඡා බළසේනා ශාඛා අංශ ප්‍රධානීහුද සහභාගී වූහ. රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරින් මුහුණ පාන ගැටලු හඳුනාගෙන ඒවාට පිළියම් ලබාදීමත් 2018 වසරේ ස්වේච්ඡා බළසේනා මුලස්ථානයේ සැලසුම් පිලිබඳ ඔවුන් දැනුවත් කිරිමත් එම සාකච්ඡාවේ අරමුණ විය.

## විවිධ පුවත්



### 9 (සෙව්) ශ්‍රීලයුසේබ

ස්වේච්ඡා බළසේනාවේ බල සංයුතිය පුළුල් කරමින් ශ්‍රී ලංකා යුද හමුදා සේවා බළකා රෙජිමේන්තුව යටතේ තවත් ස්වේච්ඡා ඒකකයක් පසුගියදා ආරම්භ කරන ලදි. 9(සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකාය නමින් ආරම්භ කරන ලද මෙම ඒකකය යුද හමුදාවේ සේවා හා සැපයුම් තවත් පුළුල් කිරීමට දායකවනු නිසැකය. මෙම ඒකකයේ ආරම්භක වැ.බ. අණදෙන නිලධාරි ලෙස මේජර් එම්ජීසීඑස් ගමගේ ආර්එස්පී රාජකාරි භාරගන්නා ලදී.

පසුගිය කලාපය හා සම්බන්ධයි...



# බුදුදහම තුළින් රෝග සුවය හා මානසික සහනය

ජීවිතයේ තනිවම ගන්නා තීරණ අසාර්ථක වූ විට හෝ යමෙක් තුළ පැවති ගැටලුව හෝ අර්බුදකාරී තත්වය තවතවත් උත්සන්න වෙමින් පවත්නා අවස්ථාවලදී එය සමනය කර ගැනීම උදෙසා උපකාරීවිය හැකි අයෙකු වෙත නැඹුරුවීම සාමාන්‍ය මිනිස් ස්වභාවයයි. එලෙස යම් අයෙකු වෙත උපදේශනය අවශ්‍යය වන්නේ ඔවුන් මුහුණපාන ගැටලු තනිව විසඳා ගැනීමට හැකියාවක්, ශක්තියත් නොමැති වෙනත් බාහිර පාර්ශවයකගේ උපකාරයන්ද නොමැති අවස්ථාවලය.

දෛනික ජීවිතයේ විවිධාකාර ගැටලු, අර්බුදයන්ට මුහුණදෙමින් අසීමිත ලෙස චිත්ත පීඩාවන්ට ලක්වී සිටින මොහොතක නිසි මැදිහත්වීමක්, උපදේශනයක් නොලදහොත් එය විවිධ මානසික රෝගී තත්වයන් ඇති කරන අතර, අවසානයේ  සිය දිවි හානිකර ගැනීමටද පෙළඹේ. මන්ද ඔහුට හෝ ඇයට පවතින අවසාන හා එකම විසඳුම ජීවිතය හානිකර ගැනීම යැයි එම අවස්ථාවේ සිතේ. එහෙත් මෙතරම් දියුණු සමාජයක එය සාධාරණ විසඳුමක් ලෙස කිසිසේත් අනුමත කළ නොහැකිය.

මෙවන් මානසික අසමතුලිතතාවයකට පත් වයස අවුː 22 ක් පමණ වන නව යොවුන් තරුණයෙක් දිනක් ඔහුගේ මව විසින් මා වෙත රැගෙන එනු ලැබීය. ඒ වන විටත් ඔහු සියදිවි හානිකර ගැනිමට වරක් උත්සාහ කර තිබුණි. වාසනාවකට එය අනූනවයෙන් වැළකී ඇත්තේ ඔහුගේ මව සිය දරුවා ගැන නිරන්තර අවධානයෙන් පසුවීම හේතුකොට ගෙනයි. මෙම තරුණයා (උදිත) මා වෙත මව විසින් කැඳවාගෙන පැමිණියේ වැඩිහිටියෙකු ලෙස දරුවා වෙත අවවාදයක් කිරීම සඳහාය. අවවාදය වෙනුවට මම බොහෝ වේලාවක් ඔහු සමග සුහදව කථා කළෙමි. .ඒ සෑම විටම වැඩිහිටියෙකු ලෙස නොව ඔහුගේම සමකාලින මිතුරෙකු ලෙස කථාබස් කිරීමටද අමතක නොකළෙමි.

උදිත නම් වු මෙම තරුණයා බාහිර පන්තියට යන අතරතුර එම පන්තියේම සිටි තරුණියක් හා ප්‍රේම සම්බන්ධයක්

ඇති කරගෙන තිබුණි. එම ප්‍රේම සම්බන්ධතාවය පැවතියේ මාස 11ක් පමණි. ඇය ඔහු හැරගොස් සිටි අතර මාස කිහිපයකට පසු වෙනත් තරුණයෙකු හා සම්බන්ධතාවයක් ආරම්භකොට ඇත. ඇයගේ හැරයාමෙන් දැඩි අසහනකාරී චිත්ත පීඩාවකට පත්ව සිටි ඔහු ඇයගේ අලුත් සම්බන්ධතාවය දැනගත් දිනයේ ලිපියක් ලියා තබා වස පානය කර දිවි තොරකර ගැනීමට තීරණය කර ඇත. කෙසේ හෝ ඔහු නොසිටි අවස්ථාවක ඔහුගේ කාමරය පරීක්ෂා කළ මවට මෙම වස බෝතලය හමුවී ඇත්තේ නිදන මෙට්ටය යට සඟවා තිබියදීය.

මා හමුවන විටද ඔහු තදබල ලෙස චිත්ත පීඩාවකට පත්වී සිටියේය. දැන් ඔහුගේ එකම අරමුණ ඇයට රිදෙන්නට ලිපියක් ලිවීමය. ඔහුගේ මානසික පීඩාව තරමක් දුරට මුදාහැරිය හැකි බැවින් මම එය හොඳ අදහසක් බව කීවෙමි. එහෙත් එම ලියන ලිපිය කැමති නම් මා හට බැලීමට දෙන ලෙසත්, ඒ අනුව මා හටද යම් අදහසක් එයට ඇතුළත් කිරීමට හැකි බවත් පැවසුවෙමි. ඔහු පසුදින මා හමුවට පැමිණියේ, එදින රාත්‍රිය පුරාම ඔහු විසින් තම හැරගිය පෙම්වතිය වෙත ලියන ලද පිටු 16ක් තරම් වු ලිපියක්ද රුගෙනය.

මම සම්පූර්ණ ලිපිය කියවුයෙමි. එම ලිපිය පුරාම ලියා තිබුණේ ඔහුගේ දෝරේ ගලායන දුක පමණි. මම මෙම ලිපියේ යම් යම් කරුණු සංශෝධනය කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියෙමි. මෙවැනි දුක පමණක් කීමෙන් ඇය තව තවත් ආඩම්බර වන සැටිත් ඔහුගෙන් ඈත්වී යන ආකාරයත් පහදා දුනිමි. මෙවැනි ආකාරයට දුක ලිවීම වෙනුවට දැන් තමා සතුටින් සිටින ආකාරයත්, ජීවිතයේ වටිනාකම අවබෝධ කරගෙන තිබෙන ආකාරයත්, පවුලේ එකම දරුවා වශයෙන් අනාගතයේ බලාපොරොත්තු ඉටුකළ යුතු ආකාරයත්, මෙන්ම මෙතෙක් ජීවිතයට ඇයගෙන් ඉගෙන ගත් බොහෝ දේවල් තමාගේ අනාගත විවාහ ජීවිතය සාර්ථක කර ගැනීමට වැඩදායක වන ආකාරයත් එම ලිපියට ඇතුලත් කරන ලෙස පහදා දුනිමි. තවද ලිපිය මේ ආකාරයට සංශෝධනය කර තමාගේ ගෞරවය ආරක්ෂා කරගන්නා ආකාරයත් හැකිතරම් කොල ප්‍රමාණය අඩු කරන ලෙසත් ඉල්ලා සිටියෙමි.

මෙම සිදුවීමෙන් දින දෙකකට පසුව ඔහු නැවතත් එම සංශෝධිත ලිපිය සමඟ මා හමුවීමට පැමිණියේය. එහි පිටු ප්‍රමාණය 12 දක්වා අඩුවී තිබූ අතර, පෙර ලිපියේ සියයට සියක් තරම් වු දුක හා සන්තාපය බොහෝ සෙයින් අඩුවී තිබුණි. එසේම මා සඳහන් කළ යම් යම් කාරණාද ඊට ඇතුළත් වී තිබිණි. ඔහු තවමත් යම් ආකාරයක කේන්තියකින් හා කළකිරීමකින් පසුවුවද එම ලිපියේ යම් ස්ථිරසාර බවක්ද තිබුණි. මම ඔහු තවදුරටත් අගය කළෙමි. එසේම ඔහු සමඟ පැය දෙකක් පමණ කථාකරමින් සිටි අතර, අවසානයේ නැවතත් සුළු කරුණු කිහිපයක් පෙන්වාදී ඒවාද ඉවත්



කරන ලෙසත්, කැමති නම් නැවතත් ලිපිය යැවීමට පෙර එක් වරක් බලන්නට දෙන ලෙසත් කීවෙමි.

සතියක් පමණ ගෙවී ගියද ඔහු නැවත මා හමුවීමට නොපැමිණියේය .එබැවින් දිනක් මම ඔහුගේ මවගෙන් මේ පිළිබඳව කරුණු විමසා සිටියෙමි. ඇය මා සමග පැවසුයේ ඔහු නිවසේ සිටින බවත්, උදෑසන ශාරීරික අභ්‍යාස සඳහා ජිම් එකට ගිය බවත්ය.

කෙසේ වුවද ඊට දින දෙකකට පසුව මට ඔහු මහමගදී මුණ ගැසුණි. ටික වේලාවක් තොරතුරු කථාකිරීමෙන් අනතුරුව මම මෙලෙස ඇසුවෙමි.

"අර ලියුම හැදුවද?... යැව්වද?... මොකද වුණේ..."

"ලියුම දෙපාරක් විතර හැදුවා.... ඒත් මම ඒක යැව්වේ නෑ..." ඔහු පෙරළා කීවේය...

"ඇයි ඒ... මොකෝ....? මම විමසා සිටියෙමි.

"වැඩක් නැනේ අංකල්... මොකටද...? ඒකිට ඕනේ නැත්නම් මට ඇති වැඩේ... මම ආපහු ලියුම් අරින්නෑ..."

මිට දින දහයකට පමණ පෙර ඔහු සිටි අසීමිත පීඩාකාරී මානසික තත්ත්වයෙන් බොහෝ දුරට මිදී ඇති බව මට වැටහුණි. ඔහු මෙම චිත්ත සන්තාපයෙන් මුදවා ගැනීම සඳහා මා යම් මනෝ චිකිත්සක ක්‍රමයක් භාවිත කළෙමි. ඔහුගේ මෙම වෙනසට එය බොහෝ සෙයින් උපකාරීවන්නට ඇතැයි මම සිතුවෙමි. එනම් ඔහු ලවා එම ලිපිය කිහිපවරක් ලිවීමට පෙළඹවීමයි. එසේම කාලය ගෙවෙන්නට ඉඩහැරීමයි. ඔහු තුළ තිබූ සෘණාත්මක සිතුවිලි වෙනුවට ධනාත්මක අදහස් ,නව බලාපොරොත්තු ඇති කිරීමයි. මේ ආකාරයට විටින් විට ලිපිය සංශෝධනය තුළින්ම ඔහුට යථාතත්වය අවබෝධ වන්නට සැලසීය.

නූතන මනෝවෛද්‍යවරුන් තම සේවාලාභින්ට ප්‍රතිකාර කිරීම උදෙසා විවිධාකාර දියුණු මනෝවිද්‍යාත්මක මූලධර්ම හෝ චිකිත්සා ක්‍රම ලෝකයාට හඳුන්වා දී තිබුණද මෙම සියලු මූලධර්මයන් වනාහි මෙයින් වසර 2550කට පෙර විසූ මෙතෙක් මිහිතලයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම මනෝ වෛද්‍යවරයාණන් වූ බුදු පියාණන් වහන්සේ විසින් ලෝකයාගේ අනුකම්පාව උදෙසා දේශනය කළ ශ්‍රී සද්ධර්මය ම බව කිසිදු සැකයකින් තොරව ප්‍රකාශ කළ හැකිය.

මා ඉහත සඳහන් කළ තරුණයා විෂයෙහි අනුගමනය කළ පිළිවෙතද එදා බුදුපියාණන් කිසාගෝතමිය උදෙසා ක්‍රියාකළ ආකාරයට බෙහෙවින් සමානය. උන්වහන්සේ කිසිවිටෙකත් දැඩි මානසික චිත්ත පීඩාවකට ලක්ව සිටි කිසාගෝතමියගෙන් දරුවා පිළිබඳ තොරතුරු විමසා නොසිටියේය. එසේම තම දරුවාට යළි පණ ලබාදිය නොහැකියැයි ද නොපැවසීය. ඒ වෙනුවට බුදුන් පවසා සිටියේ දරුවාට පණ ලබාදීම සඳහා කිසිවෙක් නොමළ ගෙදරකින් අබ මිටක් රැගෙන එන ලෙසයි. එම නගරයේ ගෙයක් ගෙයක් ගානේ අබ මිටක් සොයා ගිය ඇය අවසානයේ ලෝකයේ යථාතත්වය පිළිබඳව ස්වයං අවබෝධයක් ලබාගත්තාය. එම අවබෝධය ඇය විසින්ම තේරුම් ගෙන පසක් කර ගත් තත්වයකි. මෙවැනි දැඩි මානසික රෝග වලින් පෙළෙන පුද්ගලයින් හමුවේ ක්‍රියාකළ යුතු නිවැරදි පිළිවෙතද එයයි. එසේම ඔවුන් දෙස කරුණාවෙන් බලා සහකම්පනයෙන් යුතුව මනා ලෙස ක්‍රියා කිරීම ඉතා වැදගත්ය. මෙවැනි පුද්ගලයින් උදෙසා යොදා ගතහැකි මනෝ චිකිත්සක පිළිවෙත් රාශියක් බුදු දහමෙහි ද අන්තර්ගත වේ.

මෙම සංකීර්ණ සමාජයේ ගතකරන අපගේ දෛනික ජීවිතයේදී විවිධාකාර පුද්ගලයින් මුණ ගැසෙන අතර, විවිධ මානසික ගැටලු වලින් පීඩාවිඳින ඔවුන් උදෙසා මෙම මූලධර්ම මනාලෙස යොදා ගතහොත්, ඒ තුළින් යම් අයකුගේ දැඩි මානසික ව්‍යාකූල තත්වය සමතුලිත කිරීම උදෙසා ඕනෑම අයකුට උපකාරී වීමට හැකියාව තිබේ. බුදුදහමේ අන්තර්ගත එවැනි ක්‍රමෝපායන් ක ි හ ි ප ය ක





පහත සඳහන් පරිදි පෙන්වා දිය හැකිය.

## ආරෝචනය

එනම් තමාගේ සිතෙහි තමා එකග නොවන ප්‍රතිවිරෝධි හැඟීමක් පහළ වු විට හැකි ඉක්මනින් ඊට සුදුසු පුද්ගලයකුට ප්‍රකාශ කර සහනයක් ලබාගැනීම, එය ප්‍රකාශ කිරීමෙන් යම් පහසුවක් තමන්ට දැනේ. එමෙන්ම එය තදබල මානසික ගැටලුවක් බවට පත් වීමට ඉඩකඩ නැතිවේ. සුහද සාකච්ජවක් ආකාරයෙන් මුහුණපා සිටින ගැටලුව අවබෝධකර ගත හැකිය

## අනුකූලතා ප්‍රදර්ශනය

මෙම ක්‍රමය තුළින් අංගුලිමාල, ආලවක,ආදීන් දමනය කිරීමේදීත් කිසාගෝතමි, පටාචාරා ආදින් සුවපත් කිරීමේදීත් ඔවුන්ගේ අදහස් වලට මුලින් අවනත වී ක්‍රමයෙන් යථා තත්ත්වයට ගැනීම සිදුකොට ඇත. මානසික ගැටලුවකට මුහුණ පා ඇති අයකුට සෘජුවම ඊට විරුද්ධව උපදෙස් දීමෙන් එම ගැටලුව නිරාකරණය නොවේ. ප්‍රථමයෙන්ම සානුකම්පිතව ඊට සවන්දී ඊට එකඟත්වය පලකොට ක්‍රමයෙන් ඔහු යථා තත්ත්වයට පත්කළ හැකිය.

## සාධාරණීකරණය

යම් මානසික ගැටලුවකට මුණුන පා සිටින අයෙකුට එවැනි ගැටලු ඔහුට පමණක් නොව තවත් දහස් ගණනකට මෙන්ම, ඔහුට වඩා උසස් අයටද එබඳු ගැටලු ඇති බව පෙන්වා දී ඒ පිළිබඳ ඔහු තුළ පවතින දැඩි ආකල්පය ලිහිල් කිරීම මින් අදහස් වේ. කිසියම් ගැටලුවක් තමාට පමණක්ය යන හැඟීම නිසා ඔහු සමාජයෙන් දුරස්ථ වේ. හුදකලා වේ. එය නැති කිරීම මෙහි අරමුණයි. කිසාගෝතමියට සෑම ගෙදරකම මරණයට පත් වු අය සිටින බවට වැටහීමක් ලබාදීම මිට ප්‍රකට නිදසුනක් වේ. එසේම සිය ගණනක් වු ජාතක කථාවල බෝධි සත්වයන් පෙර භවයන්හී දී විවිධ ගැටලු වලට මුහුණ පා තිබෙන බව සඳහන් කිරීමෙන්, බෝධි සත්වයන්ට පවා මෙබඳු ගැටලු ඇති වී නම් අප ගැන කියනු කවරේදැයි, ඒත්තු ගැන්වීමෙන් මානසික රෝගියා සැනසීමක් ලබයි.

## උත්තරාරෝපණය

කෙනෙක් යම් අරමුණක් ලගා කරගැනීමට නොහැකිව, ඉච්ඡාභංගත්වයට පැමිණ එය මානසික ගැටලුවක්වී තිබේ නම් ඔහුට ඊට වඩා වැදගත් අපේක්ෂාවක් ලබා දීමෙන් නැතහොත් ඒ සඳහා යොමු කරවීමෙන් සහනයක් ලබාදීම මින් අදහස්වේ. ජනපද කල්‍යාණි පිළිබඳ අපේක්ෂාභංගත්වයට පත් වු නන්ද කුමරුට දිව්‍යාංගනාවන් පෙන්වා එම ගැටලුව නිරාකරණය කිරීමත්, ඒ තුළින් ඊටත් වඩා වැදගත් වු රහත් බව නමැති අපේක්ෂාව කරා යොමුකිරීමත් ක්‍රමානුකූලව සිදුවිය. දැඩි චිත්ත පීඩාවට පත්වු පුද්ගලයා එක්වරටම අරමුණක් කරා යොමු නොකොට, ගැටලුවට ආසන්නතම අරමුණ පෙන්වා පිළිවෙලින් අවශ්‍ය ස්ථානයට ගෙන ඒම සාර්ථක වේ.

## මනෝ විශ්ලේෂණය

මානසික ගැටලුවට පදනම් වු චිත්ත තත්ත්වයන් හේතුඵල ධර්මානුකූලව යම් පුද්ගලයෙකුට අවබෝධ කරවීම මෙයින් අදහස් කෙරේ. එය හටගත් ආකාරය පිළිබඳව විශ්ලේෂණාත්මකව කරුණු පහදා දෙනු ලැබේ. එසේ වුවද, මෙම පහදාදීම කළ යුත්තේ ගැටලු රහිත පරිපූර්ණ මානසික තත්ත්වයකට පත් වු තැනැත්තෙකු මගිනි. මන්ද මඩෙහි ගිලුණු පුද්ගලයකුට තවත් එබඳු පුද්ගලයෙකු ගොඩගත නොහැකිය.

**කර්නල් එම්පීපී පෙරේරා**
ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්දීකරණ නිලධාරි
ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර)

# කෙළිබිමේ
# දිලෙන විරු තරු



පසුගිය නොවැම්බර් මස 14,15 සහ 16 යන දිනයන්හිදී පනාගොඩ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ දී පැවති අන්තර් රෙජිමේන්තු බර එසවීමේ තරඟාවලියේ කිලෝ ග්‍රෑම් 69 බර පන්තිය නියෝජනය කළ 18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙ/109197 සාසෙ කරුණාරත්න එල්කේසීඑම් විසින් එහි ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලදී.



ජූඩෝ ක්‍රීඩාවෙන් ජාතික තලයේ ජයග්‍රහණ රාශියකට හිමිකම් කියන සෙ/කියු104413 සාසෙ පියතිලක එච්කේඩී විසින් පසුගිය දෙසැම්බර් මස 19,20,21 යන දිනයන්හි කොළඹ ජූඩෝ සම්මේලන ක්‍රීඩාගාරයේදී පැවැති 2017 ජාතික ජූඩෝ තරඟාවලියේ දී කි්‍ර.ගෑ. 45 බර පංතියේ තෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී. ඔහු මේ වන විට ජාතික තලයේ ජයග්‍රහණ රාශියකට හිමිකම් කියන 18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් ක්‍රීඩකයෙක් වේ.



දියතලාව සැඟවුනු වෙඩික්කරු පුහුණු පාසල වෙතින් පැවත්වූ පාඨමාල අංක 19 සඳහා සහභාගී වූ 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙ/කියු110668 ලා/කෝ ජයවර්ධන එම්ජීඅයි එම පාඨමාලාව ඉතා සාර්ථකව හදාරා තිබේ.



ආසේමු (කිළි) යටතේ පාලනය වන ඒකක අතර සංවිධානය කෙරුණු එල්ලේ තරඟාවලියක් ඉකුත් දා පැවැත්විණ. මේ සඳහා තරඟ වැදුණු ඒකක කණ්ඩායම් සියල්ල අභිබවා 21 (සේවා) ශ්‍රීලපාහ කණ්ඩායම එහි ජයග්‍රහණය හිමිකරගත්හ. ආසේමු (කිළි) ආඥාපති මේජර් ජෙනරල් අජිත් කාරියකරවන යූඑස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම තරඟාවලියට 57, 65, 66 සේනාංකාධිපතිවරුන්, බළසේනාධිපතිවරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.



ආසේමු(කිළි) බලප්‍රදේශය යටතේ ඇති ඒකක වල සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු එල්ලේ තරඟාවලියේ අනුශූරතාව 11(සේවා) ගජබා රෙජිමේන්තු කණ්ඩායම දිනා ගැනීමට සමත් වූහ. අවසන් තරඟාවලිය ආසේමු (කිළි) ආඥාපති මේජර් ජෙනරාල් ඒ කාරියකරවන යූඑස්පී එන්ඩීසී ගේ සහභාගිත්වයෙන් කිලිනොච්චිය පරෙව්පච්චාන් ක්‍රීඩා පිටියේදී පැවති අතර එහි අනු ශූරතාව දිනාගත් කණ්ඩාය මෙහි දැක්වේ.



ආසේමු(කිළි) යටතේ පාලන වන ඒකක අතර යුධ ශාරීරික අභ්‍යාස තරඟාවලියක් පසුගියදා පැවැත්විණ. එහි හොඳම රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස 11(සේවා) ගජබා රෙජිමේන්තුවෙහි සෙ/7ජී බනි 11 සුසන්ත ජී කුසලානය හිමිකර ගත්තේය. එම බළලත් නිළධාරි (දකුනේ) සිය ඒකක අණදෙන නිළධාරි සමඟ.



10(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තු අන්තර් කණ්ඩායම් මලල ක්‍රීඩා තරඟාවලිය එම ඒකක අණදෙන නිළධාරිගේ ප්‍රධානත්වයෙන් පසුගියදා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. සෙබළුන්ගේ ක්‍රීඩා හැකියාවන් ඔප්නංවා ගැනීමටද, ඒඒ කණ්ඩායම් අතර සුහදත්වය වර්ධනය කර ගැනීමටද එම තරඟාවලිය හරහා නොමඳ පිටිවහලක් විය.

# සුබ උපන්දිනයක්



දහවන වියට පාතැබූ
**ඒ.ඩබ්ලිව් තරුක නිම්සර**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00604
ලා/කෝ ප්‍රියන්ත කුමාරසිරි
ඒඩබ්ලිව්



නවවන වියට පාතැබූ
**ඩී. එම්. කනිෂ්ක චාමිකර**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00397
සාසෙ ගුණතිලක ඩීඑම්



හයවන වියට පාතැබූ
**ආර්. පී. දෙනුවන්දි විහාරා**
දියණියට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු පවුලේ
සැම...
සෙ/16එච්00700
ලා/කෝ ආසිරි කුමාර ආර්පීජී



හයවන වියට පාතැබූ
**හිමන්දි උදම්කා වර්ණකුලසූරිය**
දියණියට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු පවුලේ
සැම...
සෙ/16එච්00169
බනි II උදය කුමාර
ඩබ්ලිව්එම්එස්



දාහත්වන වියට පතැබූ
**ආර්. ඩී හිරුසි දෙව්මිණි**
දියණියට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00289
බනි II දිසානායක පීකේආර්.




එකොළොස්වන වියට පාතැබූ
**ආර්. ඩී සෙහාන් අකලංක**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00289
බනි II දිසානායක පීකේආර්.



දහවන වියට පාතැබූ
**පී. එච්. අමන්දි කවීෂා**
දියණියට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු පවුලේ
සැම...
සෙ/16එච්00253
ලා/කෝ සුරංග පීඑච්ආර්.



පසුගියදා හත්වන වියට පාතැබූ
**ආර්. තෙනෙත් ධනේත**
**රාමනායක**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු පවුලේ
සැම...
සෙ/16එච්00700
කෝප්‍රල් ප්‍රේමකුමාර ආර්එස්.



පසුගියදා දොළොස්වන වියට
පාතැබූ
**ආර්. කවීෂ පබසර රාමනායක**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00700
කෝප්‍රල් ප්‍රේමකුමාර ආර්එස්.



පසුගියදා සිව්වන වියට පාතැබූ
**හිමාෂි සෙව්මිනි දියණියට**
සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00383
ලා/කෝ දයානන්ද ටීජීජ්



පසුගියදා තුන්වන වියට පාතැබූ
**ඒ. එම්. ඉමෙත් සදෙව් බණ්ඩාර**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00481
ලා/කෝ බණ්ඩාර ඒඑම්ජ්



පසුගියදා තුන්වන වියට
**පාතැබූ ඒ. ආර්. විහගි**
**ගිම්හානි ජයතිලක**
පුංචි දියණියට සුබ උපන්
දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/එච්101055
සාසෙ රජපක්ෂ ඒඑස්කේජේ

# සුබ උපන්දිනයක්



තුන්වන වියට පාතැබූ
**ටී. සංචිත ශික්ෂණ කරුණාරත්න**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16ඩී00311
සැරයන් කරුණාරත්න
ඊජේජේඑස්



දහවන වියට පාතැබූ
**ඒ. සපිදු කවීශ කරුණාරත්න**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00113
කෝප්‍රල් සුනිල් කරුණාරත්න ඒ



දහවන වියට පාතැබූ
**ඒ. සචිනි කවීශා කරුණාරත්න**
දියණියට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු පවුලේ
සැම...
සෙ/16එච්00113
කෝප්‍රල් සුනිල් කරුණාරත්න ඒ



පස්වන වියට පාතැබූ
**පී. ජී. සඳෙව් දම්සර සිරිවර්ධන**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු පවුලේ
සැම...
සෙ/16එච්00756
සාසෙ සිරිවර්ධන ටීපීආර්එස්



තුන්වන වියට පාතැබූ
**ජනනී චතුමාලි වන්නිනායක**
දියණියට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00307
සැරයන් වන්නිනායක



අටවන වියට පාතැබූ
**රන්දික ප්‍රමෝද් පියරත්න**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/16එච්00071
බනි II පියරත්න යූ



තුන්වන වියට පාතැබූ
**නෙතුදි සාවින්ද්‍යා ප්‍රියදර්ශන**
දියණියට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ ආදරණීය
අම්මා, තාත්තා ඇතුළු පවුලේ
සැම...
සෙ/10එච් 01530
සාසෙ ප්‍රියදර්ශන එන්ඒඑන්එස්



හයවන වියට පාතැබූ
**වයි. එම්. ඉමේෂ් චින්තක**
හසරැල් පුතුට සුබ උපන්
දිනයකට ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
සෙ/100005
ලා/කෝ සම්පත් කුමාර
වයිඑම්එස්



පළමු වියට පාතැබූ
**විනුවර මෙත්වින් විජේකෝන්**
පුතුට සුබ උපන් දිනයකට
ආසිරි පතන්නේ
ආදරණීය අම්මා, තාත්තා ඇතුළු
පවුලේ සැම...
නි/9875 ලුතිතන්
කේඑම්ඩබ්ලිව්එම්ටීඩී
විජේකොන් ශ්‍රීලංරබ



පසුගියදා නවවන වියට පැතබූ
**පබෝද අකලංක**
පුතුට සුභ උපන් දිනයකට
ආසිරි පත්නේ ආදරණීය අම්මා,
තාත්තා, ඇතුලු පවුලේ සැම....
මේජර් වයිඑම්ජ්බී යාපා
ශ්‍රීලංසිරෙ 11 (සෙව්) ශ්‍රීලංසිරෙ



පසුගියදා දහවන වියට පැතබූ
**සත්සර කාවින්ද හීනාබෝව**
පුතුට සුභ උපන් දිනයකට
ආසිරි පත්නේ ආදරණීය අම්මා,
තාත්තා, ඇතුලු පවුලේ සැම....
සෙ/5ජ්02708 ලා/බො පුෂ්ප
කුමාර එච්ජීඑම්.
5 (සෙව්) ශ්‍රීලකාහ



පසුගියදා දෙවන වියට පැතබූ
**දිනෙත් මෙත්සර දිසානායක**
පුතුට සුභ උපන් දිනයකට
ආසිරි පත්නේ ආදරණීය අම්මා,
තාත්තා, ඇතුලු පවුලේ සැම....
සෙ/1පී06027 ලා/කෝ ආනන්ද
ඩීඑම්.

# විශිෂ්ටයන් අතර
# විශිෂ්ටයෙකු වී



ශ්‍රී ලංකා යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු පියවර කෝදු තරඟාවලිය 2017 සඳහා සහභාගී වූ සියලු සරඹ උපදේශකයින් අතුරින් 17 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සරඹ උපදේශක සෙ/17කිු00597 මාණ්ඩලික සැරයන් දිසානායක ඩීඑම්එස් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත් විය. යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ සුරතින් අදාළ ජයග්‍රාහී කුසලානය හා සහතික පත් පිරිනැමීම සිදුකරන ලදී. මාණ්ඩලික සැරයන් දිසනායක ඩීඑම්එස් යුද්ධ හමුදාධිපති තුමා අතින් ත්‍යාග/ සහතිකපත් ලබාගත් අවස්ථාව



ඉන්දියාවේ බිංනාගුරී පිහිටි කොමිෂන් නොලත් නිලධාරි පුහුණු පාසල වෙතින් 2017 නොවැම්බර් 06 දින සිට 2018 ජනවාරි 13 දින තෙක් පැවැත්වූ කණිෂ්ඨ සංග්‍රාමික නායකත්ව පාඨමාලා අංක 30 සඳහා සහභාගීවූ ස්වේච්ඡා බළසේනාවට අයත් 7(සෙව්) ගජබා රෙජිමේන්තුවේ සෙ/7ජී02072 සැරයන් රණවීර එම්ජ්යූබී එම පාඨමාලවට එක්වූ සියලු විදෙස් සිසුන් අතරින් දක්ෂතම සිසුවාට හිමි සම්මානය හිමිකර ගැනීමට සමත් විය.

සැරයන් රණවීර එම්ජ්යූබී විසින් අදාළ සම්මානය හා සහතිකපත එම පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඒ සමන්තා අතින් ලබාගත් මොහොත...





ශ්‍රී ලංකා යුද හමුදා ඉතිහාස කතාව තුලදී ප්‍රථම වරට සාහිත්‍යකරණය සඳහා ජාතික තලයේ සම්මානයන්ට හිමිකම් කියූ 2(සෙව්) ගැමුණු හේවා බලකායට අයත් ලා/කෝ සුජීව කුමාර කෝවිලතැන්න පසුගිය පෙබරවාරි මස 14 වන දින යුද්ධ හමුදා මුලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී වෙත ඔහුගේ සම්මානනීය කෘතිය වූ ''වැකඩවර'' නව කතාව හා ''ඌවේ වංහුං'' නම් ශ්‍රාස්ත්‍රිය, ග්‍රන්ථය පිරිනමන ලදී. මෙම අවස්ථාවට ගැමුණු හේවා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඩීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී හා ගැමුණු හේවා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් කේඩීසීජීජේ තිලකරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ද එක්වූහ. ස්වේච්ඡා බළසේනා මුලස්ථානයේ රණවරුණ සඟරාවේ විෂය භාර ලිපිකරු ලෙස රාජකාරි කරනු ලබන ඔහු විසින් අදාල කෘතින් ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී වෙතද පසුගියදා ස්වේච්ඡා බලසේනා මුලස්ථානයේදි පිරිනමන ලදී.



බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදි 2017.12.23 වන දින ත්‍රෛනිකායික මහානාහිමිවරුන් ගේ හා ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයේ පැවති ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවයේදී බෞද්ධායුර්වේදී මනෝවිද්‍යා උපදේශණ පිළිබඳ පශ්චාත් උපාධිය ආසේමු (නැ) ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්ධිකරණ නිලධාරි කර්නල් එම්පීපී පෙරේරා වෙත පිරිනමන ලදී. බෞද්ධායුර්වේදී මනෝවිද්‍යා උපදේශනය විෂය ශ්‍රී ලංකාවේ පවත්වන ලද ප්‍රථම අවස්ථාව මෙය වු අතර එහි ප්‍රථම කණ්ඩායමට කර්නල් එම්පීපී පෙරේරා ද අයත් වීම විශේෂත්වයකි.

# නව වෛද්‍ය පරීක්ෂණාගාරයක්









දියතලාව ස්වේච්ඡා පුහුණු පාසලේ නවීකරණය කරන ලද වෛද්‍ය පරීක්ෂණාගාරය ඉකුත් ජනවාරි 27 දිනට යෙදුණු සුබ මොහොතින් යුදහමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජේනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයු පීඑස්සී ගේ සුරතින් විවෘත විය. එම අවස්ථවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක, එම පුහුණු පාසලේ සේනාවිධායක ඇතුළු එහි කාර්ය මණ්ඩලයද විද්වත් වෘත්තිකයෝ රැසක්ද සහභාගී වූහ. තවද ඒදින ස්වේච්ඡා බළසේනා සේනාවිධායක තුමා විසින් විද්වත් වෘත්තික නිලධාරීන් සඳහා වටිනා දේශනයක්ද සිදු කරන ලදී.

# 114 අභිමානවත් සැමරුම



ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන දියතලාවේ පිහිටි ස්වේච්ඡා බළසේනා පුහුණු පාසල සිය 114 වන සංවත්සරය පසුගියදා සේනාවිධායක කර්නල් ඒජේ ගුණවර්ධන ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් එම පුහුණු පාසල් පරිශ්‍රයේදී සමරන ලදී. ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් හා යුද හමුදා සම්ප්‍රදායන්ට ගරු කරමින් පැවත්වූ මෙම සංවත්සර උත්සවයේදි සේනාවිධායක වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිල දිවාභෝජන සංග්‍රහයක් පැවැත්වීම හා සංවත්සර දිනය සිහිකිරීම සඳහා පැළයක් රෝපණය කිරීම ආදී කටයුතු රැසක් සිදුකරන ලදී. මෙම අවස්ථාවට එම පුහුණු පාසලේ නිධාරිහු ද සෙසු නිලයෝ රැසක්ද සහභාගී වූහ.



# පය ඇඳි බිම
# ළය රැඳි මතක

දශක තුනක යුද්ධය නිමවී වසර 9 ක් සම්පූර්ණවීමට ආසන්නය. නිදහස හා සාමයේ ප්‍රතිලාභ භුක්ති විඳිමින් සමස්ත රටවැසියන්ම සිය ජීවන අරගලයන්හි නිරතව සිටින අතර තුර රණවිරුවෝද එතෙක් කලක් තම අතරැඳි ගිනි අවි පසෙකලා නිහඬ මෙහෙවරක නියැලී සිටිති. එවක සටන් පැවති උතුරු නැගෙනහිර බිම්කඩ පුරා ඇරඹි සංවර්ධන සංග්‍රාමයේ ප්‍රතිඵලයෙන් එහි පෙර වූ යුද්ධයේ නටඹුන් සහමුලින්ම මැකී ගොස්ය.

සියල්ල එසේ වුවද රණබිමෙහි මානුෂිය ගුණ රැඳි මතක සටහන් එලෙස මැකී යා නොදී සමාජගත කිරීම කාලීන අවශ්‍යතාවක් සේ හැගේ. රණවිරුවන් සතුව තිබූ වීරත්වය, දේශානුරාගය, බිය සැක දුක වේදනාව සතුට හමුවේ ඔවුන් ජීවිත වලට මුහුණ දුන් අපූරුවද එකී මතක සටහන් විශ්ලේෂණය කිරීමේදී කදිමට විද්‍යාමානවේ. “පය ඇඳිබිම ළය රැඳි මතක” තුළින් දිගහැරෙනුයේ එදවස රණබිමේ සැඟවුණු සුන්දර කතන්දරයි...



එවකට මා රාජකාරියෙහි නිරත වූයේ මඩකලපු දිස්ත්‍රික්කයේ ''පන්කුනාවේලි'' නම් වූ ප්‍රදේශයේ පිහිටි කඳවුරකය. මාගේ මතකය අනුව එය 1993 වසර විය. එකල ත්‍රස්තවාදීන්ගේ මර්මස්ථානයක් වූ ''තොප්පිගල''සමීපයේ පිහිටා තිබූ එම කඳවුර හුදෙකලාව පිහිටි අති දුෂ්කර එකක් විය. එනිසාම ඊට ත්‍රස්තවාදීන්ගෙන් නිරන්තරව එල්ල වූ තර්ජනද අඩු නොවුණි. 4 ගජබා රෙජිමේන්තුවට අයත්ව තිබූ එම කඳවුරෙහි සියයකට ආසන්න භට පිරිසක්ද සිටියහ. එවක 2/ලුතිතන් නිලයේ පසුවූ මා කණ්ඩභාර නිලධාරියෙකු ලෙස එම කඳවුරට යාව කටයුතු කරන ලද අතර, සෙබලුන් 30 දෙනෙක් පමණ එහි මා යටතේ වූහ.

කණ්ඩභාර නිලධාරියෙකු ලෙස කටයුතු කිරීමේදී තමන් යටතේ සිටින සෙබලුන්ගේ වෘත්තිය හා පුද්ගලික ගැටළු පිළිබඳව සොයාබැලීම එම නිලධාරියා සතු අනිවාර්ය වගකීමකි. ඒ අනුව මා යටතේ සිටි සෙබලුන්ගේ සුවදුක් සොයා බැලීම මාවෙත පැවරී තිබුණි. එහිදී සෑම සෙබළෙකුම මාස කිහිපයකට වරක් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට ඔවුන්ගේ ගැටළු පිළිබඳ සොයා බැලීම සිදුකරන ලද අතර එකී තොරතුරු මවිසින් පොතකද සටහන් කරන ලදී.

එක්තරා දිනයක කඳවුරෙහි සෙබලුන් වැඩිපුර ඒකරාශී වන තැනක තිබූ ලිපියක් මා අතට පත්විය. අතට ගත් සැනින් එය සෙබළෙකුට සිය හිතෛෂී වන්තයෙකුගෙන් ලැබූ එකක් බැව් පැහැදිලි විය. ඒ වන විට ද එහි කවරය විවෘත කොට තිබූ බැවින් මම එම ලිපිය කියවන්නට උත්සුක වීමි. විශේෂයෙන්ම සෙබලුන් සිය නිවෙස් සමග ගනුදෙනු කිරීමේදී සපයන තොරතුරු සේම නිවෙස් වලින් සෙබලුන් වෙත ලැබෙන පිණිවුඩ පිළිබඳවද නිළධාරීන් ලෙස අප විමසිලිමත් වීම නිරන්තරව සිදුකරන ලදී. එකල පැවති ආරක්ෂක තත්වය හේතුවෙන් එසේ සිදුකළයුතුව තිබුණි. කෙසේ හෝ



අදාළ ලිපිය කියවීමෙන් මා තුළ හටගත්තේ දැඩි කනගාටුවකි. ලිපියට අනුව කඳවුරේ සිටින සෙබලෙකුට එය සිය නැගණිය විසින් ලියා එවා තිබූවකි. එමගින් ඔවුන්ගේ නිවසේ උද්ගතව ඇති දැවෙන ප්‍රශ්න සමූහයක් පිළිබඳව සංවේගාත්මකව කරුණු රැසක් ලියා තිබුණි.

පසුව ලිපියෙහි වූ තොරතුරු අනුව අදාල සෙබළා සොයා ඔහු මවෙත ගෙන්වා ගන්නා ලද අතර, ඒ වන විටද ඔහු එම ලිපිය සොයමින් සිට ඇත. නමින් ආධුනික සෙබළ දයාසිරි වූ ඔහු බිබිල ප්‍රදේශයේ පදිංචි අයෙකි. ඒ වන විට යන්තම් වයස අවුරුදු 20 ක් ඉක්මවූ ඔහුට මවුපියන් හැරුණු විට බාල සොහොයුරියක් හා සොහොයුරෙක් වූහ. බොහෝ දරිද්‍රතාවයෙන් පෙළුණු එම පවුලේ මාපියෝ ගොවිතැන් කටයුතු වල තිරත අය වූහ. තවදුරටත් කරුණු සොයා බැලීමේදී එම සෙබළා මාස තුනකට ආසන්න කාලයක් නිවාඩු ගොස් තිබුණේද නැත. එවක කඳවුරෙහි සිටි සෑම සෙබලෙකුම පාහේ නිවාඩු යෑම් සිදුකරන ලද්දේ අවම වශයෙන් මාස දෙකකට වැඩි කලක් ගතවූ පසුවය. විවාහක අයට පවා එම තත්වයේ වෙනසක් නොවුණි.

පසුව මා ඔහුව සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමේදී ඔහු බොහෝ සංවේදී තොරතුරු රැසක් මා හමුවේ තැබුවේය. ඒ අනුව ඊට පසුදාම ඔහුව නිවාඩු යැවීමේ දැඩි අවශ්‍යතාවක් මා තුළ මතු විය. එහෙත් පැවති ආරක්ෂක තත්ත්වය ඊට එරෙහි විය. එවකට සියලු පාලන කටයුතු සඳහා හමුදා සාමාජිකයන් හට එහි මාර්ගය භාවිතා කිරීමට සිදුවූයේ සතියකට දෙවතාවක් පමණි. එහිදීද යාබදව තිබූ ''ඉලුප්පපඩිචේන'' හංදිය වෙත ළඟාවීම සඳහා කඳවුරේ සිට කිලෝ මීටර් දහයක් පමණ දුරක් පයින් හෝ ට්‍රැක්ටර් වලින් යායුතුව තිබුණි. එතැන් සිට ද ''චෙන්කල්අඩි'' කඳවුර දක්වා යායුතු වන අතර, ඒ සඳහාද තවත් විනාඩි 30ක් පමණ ගතවේ. එහි සිටද හමුදා ආරක්ෂාව මධ්‍යයේ නිවාඩු යන පිරිස් වැලිකන්ද තෙක් ඇරලවීම සිදුකෙරේ. මේ ආකාරයට සෙබළෙකු නිවාඩු යාමේදී ක්‍රියාත්විත පරිසරය පසුකිරීමටම පමණක් දිනක්ම ගතවේ.

කෙසේ හෝ අදාළ සෙබළා දින දෙකක් ඇතුළත නිවාඩු යැවීමට මා හට හැකි විය. එහෙත් ඔහු නිවාඩු ගියද ඔහුගේ නැගණිය ලියා එවා තිබූ ලිපියෙහි තොරතුරු මා සිතෙහි චිත්‍රපටයක මෙන් මැවී පෙනෙන්නට විය. එක්තරා දිනක රාත්‍රියේ එකී ලිපියෙහි අඩංගුව තිබූ තොරතුරු ඇසුරෙන් මා පහත කවි පද අකුරු කලේ සිත තුළ උපන් වේදනාව යටපත් කර ලීමට දුරූ අසාර්ථක උත්සාහයද හමුවේය.



## ලොකු අයියාට...

අද නැතත් හෙට දිනේ
නුඹ ගෙදර එයි කියා
මෑණියන් මග බලා
කඩුල්ලේ ඉන්නවා

තෙල් බේත් වලින් පිරී
පියාණන්ගේ සවිය
එළිපත්තෙ ඇඳ මතම
තුන්වේල ගෙවෙනවා

වහලෙ පොල් අතු දිරා
වැහි බින්ඳු සීරුවට
පොද වැස්සකට වුවත්
හරී සීත ගෙනෙනවා

කොළ ඉවර පොත් මිටිය
එකින්එක පෙරලලා
පොඩි මල්ලි ඉලක්කම්
පිටකවරෙ ලියනවා

තෙල් නොමැති ලාම්පුවෙ
මලානික කහ එළිය
පුංචි සුළඟට උනත්
බයවෙලා සැලෙනවා

පංතියේ පළවෙනිය
මම උනත් මෙදාවර
අන්තිමය මට වඩා
ලොකු තෑගි ලබනවා

අප්ප ඇති ලෙඩ ඇඳේ
අම්ම ඇති ඉඳිකඩේ
ලොකු අයියෙ නුඹ නොමැති
දුකට කවි ලියනවා

**මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ**

# කෙළිබිමට පෑයූ අයෝමය තරුවක්
# "2017 මිස්ටර් ශ්‍රී ලංකා ජූනියර්"







2 ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකායට අයත් සෙ/ 2017VFRD 94319 ආධුනික සෙබල කුමාරන් එම් "2017 මිස්ටර් ශ්‍රී ලංකා ජූනියර්" ලෙස ඉකුත්දා කිරුළු පැළඳීය. එසේම එම තරගාවලියේම කි.ගෑ 60 බර පන්තියේ රන් පදක්කම හිමි කරගැනීමටද ඔහු සමත් විය. පසුගිය වසරේ පැවති 53 වන ජාතික ක්‍රීඩා උළෙලේදී කි.ගෑ 60 බර පන්තියේ රන් පදක්කමද දිනා ඇති ඔහු කායවර්ධන ක්ෂේත්‍රයේ දිගු ගමනකට මුල පුරා ඇති අයෙකි. යුද හමුදාවේ අයෝමය අභිමානය කෙළිබිමෙහි පතුරන්නට රණවරුණ තුළින් අපිද ඔහුට මෙලෙස සුබ පැතුම් ගෙන එන්නෙමු.

## විවිධ පුවත්



### 18 ශ්‍රීලංජාආබමු

වාකරේ පනිච්චන්කර්නි ප්‍රදේශයේ ස්ථානගත 18 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ඉදිකරන ලද නව අණදෙන නිලධාරි කාර්යාලය වැ.බ. අණදෙන නිලධාරි මේජර් එම්පීඩී ප්‍රේමවංශ ආර්එස්පී ශ්‍රීලංජාආබමු විසින් විවෘත කිරීමෙන් පසු රජකාරි ඇරඹූ අයුරු...

### 3 ශ්‍රීලංජාආබමු

3 ශ්‍රීලංජාආබමු සේවා වනිතා ශාඛාව වෙතින් එම ඒකක සමාජිකයින් ගේ පාසල් යන දූදරුවන් වෙනුවෙන් මෙවරත් පාසල් පොත් හා උපකරණ බෙදාදීමක් පසුගියදා එම ඒකක සේවා වනිතා සභාපතිනි නිමන්තිකා දිසානායක මහත්මියගේ සංකල්පයකට අනුව සිදුකරන ලදී. මෙම අවස්ථාවට අණදෙන නිලධාරි මේජර් සම්පත් දිසානායක ශ්‍රීලංජාආබමු ද එක්විය.



# රස කැලි

### රෙදි ඇතිවද? නැතිවද ?

ගුවන් ගමනක් යෑම සඳහා පැමිණි මගියෙකු ඇමතූ සේවිකාවක් ඔහු "කොපමණ බරද" විමසුවේය..

"ඇඳුම් ඇතුවද? නැතුවද" මගියා ප්‍රශ්න කළේය..

"යන්න කැමති ඕනෑම විදියකට!" යයි සේවිකාව අහක බලමින් පැවසුවාය..

### දෙවියන් වහන්සේද ගැලවෙන සේක්වා..

භක්තිමත් පවුලකට අයත් කුඩා දැරියක් දෙවියන් වහන්සේ අමතා යාච්ඤා කරන ගමන් ඇගේ එක් පැතුමක් මෙලෙස ඉදිරිපත් කළාය.

අනේ දෙවියන්වහන්ස අපේ තාත්තව අම්මව ,ආච්චිව හොඳට පරිස්සම් කරන්න. තමුන්නාන්සේද පරිස්සම් වෙලා ඉන්න.. නැත්තම් අපි ඔක්කොම සුං!"..

### දේව දූතියක්

බීමත් පුද්ගලයෝ දෙදෙනෙක් නිවස බලා පා ගමනින් ගමන් කරමින් සිටියහ..

"මගේ ගෑනිව දකින්න මම කොච්චර ආසද එයානම් දේව දූතියක්".. යි එකෙක් කියා සිටියේය..

"උඹ නම් හරිම වාසනාවන්තයෙක් මගෙ ගෑනි නම් තාම පණ පිටින් ඉන්නවා" යි අනෙකා පිළිතුරු දුණි..



### කටුව ගැසීම

බිරිඳ : අනේ මෙයා මගේ මේ හැට්ටේ කටුව පොඩ්ඩක් ගහන්කෝ

''ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳව, පුරුෂාධිපත්‍යට එරෙහිව කන්තාවෝ'' සංවිධානයේ සංවත්සරය ට යෑමට සුදානම් වෙමින් බිරිඳ තම සැමියාට පැවසීය. මේ වන විට සැමියා සිටියේ දිනපතා පත්තරය කියවමිනි.

සැමියා : ''මහලොකුවට ස්ත්‍රී අයිතිවාසිකම් ගැන සටන් කොරන්න යනවා. ඒ වුනාට පිරිමි නැතිනම් තමුසෙලාට හැට්ටේ කටුව වත් ගහගන්න බෑ වෙන එකක් තියා.''

බිරිඳ: ''පිරිමි නිසා තමයි ඔයි! අපේ හැට්ටවලට කටු ගහන්න වෙලා තියෙන්නේ. නැතිනම් හැට්ට නැතුවම යන්න තිබුණා.''

### බ්‍රැන්ඩි

''ඔය බෝතලේ මොනවද?

වෛද්‍යවරයා
රෝගියාගෙන් විමසීය.

''මේ බ්‍රැන්ඩි''

''මං ඔහේට කිව්වනෙ, මත්පැන් බොන්න එපා කියලා. මතක නැද්ද...?''

''මතකයි ඩොක්ටර්. ඒ උනාට මෙතන වැඩිය නෑ''
''වැඩිය නෑ, ඔය හොඳටම වැඩිය''

''මේ සේරම මගෙ නෙවෙයි. යාලුවෙකුගේ කොටහකුත් මේ බෝතලේ තියෙනවා ඩොක්ටර්''

''එහෙමනං යාලුවගේ කොටහා බෝතලේ තියෙද්දී ඔහේගෙ කොටහා බිමට හලන්න''

''අනේ ඒක කොහොම කරන්නද ඩොක්ටර්...? බෝතලේ උඩින්ම තියෙන්නේ යාලුවගේ කොටහනේ''

# කවි
## මල් යාය

### මනුස්සකම

ලස්සන රුවට ඇයි ඇස් දෙක රැවටෙන්නේ
ගතිගුණ තමයි කෙනෙකුගෙ වැදගත් වන්නේ
රූපය දිනෙන් දින වැහැරී මැල වෙන්නේ
හොඳ ගතිගුණයි හැමදාමත් පවතින්නේ
දහසක් ගැටුම් මැද පියවර තැබූ මැන
දුප්පත් තමයි දුක දන්නේ දිවියේ එන
රිදවුම් තවත් දී කවදත් මහට නැත
බල්ලොත් බුරන්නේ අපිටයි පයින් යන

සෙ/17එච්00216
**කෝප්‍රල් චමින්ද කුමාර පීපී**
17 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව

---

### අධිෂ්ඨානය

කම්බි වැට අල්ලා ගෙන
කිමද නුඹ
බිම බලා සිටින්නේ
එහා ලෝකය
අපට බර වැඩිය
නෙතු අගින් වැටෙන
අම්මගේ කඳුලු හංගා
ඇය අපව ජීවත් කරවයි..
නැගණියේ...
ජයගන්න උගනිමු
අම්මා සනසන්න....

සෙ/2බ00815
**ලා කෝ චතුර තුශාර පීජීඑන්**
2 සෙව් ශ්‍රිලයුවෙබ
යුහ ජනපදය, පනාගොඩ

---

### සඳ ...... සබඳ.....

කිමද ?
නුඹ නිහඬ අද...
තරු ඔතරම් මුමුණද්දිත්....
සිත රිදුනිද... සිහින බිඳුනිද...
සඳ සාවිය පැන ගියාද.....?
නුඹ නාඬන්...
හිරු කොයි හෝ හිඳ...
නුඹට එළිය දෙයි....
තනි වී නැත නුඹ...
මුළු ලොවම බලා හීදී......
විඳින්නට සිසිල් රැස...
සඳ ..... සබඳ.....

**චත්‍රිකා හංසමාලි**

### *The sorrow and the shame*

They say never give up.
Never give in.
Keep fighting that fight
So the devil doesn't win.
Through the hurt and the pain,
The sorrow and the shame,
The one thing you need to remember
Is that tomorrow is never the same.
Hold onto your hopes and dreams,
For your fears are less than they seem.
So to all of those who feel like they are losing the fight,
And to those who feel like there is no hope in sight,
Take a minute to look at the sky
And remember that there's something
Out there bigger than you and I.
Just like today,
The sun will shine again.
Through the clouds and the rain,
The sun still remains,
And all the darkness will fade away.
So hold your head high,
And feel the warmth.
It may remind you
What you are truly worth.

Lt Kalana Gunawardana - SLRC
Gampola

---

### බුදු සමිඳේ

ඇලෙන ගැටෙන මේ ලෝ දහමේ
නොගැටි නොබැඳී සිටිනා විලසේ
පසක් කළේ මග මේ කල්පේ
ඔබයි මහා විරු සමිඳේ

විඳින සැපේ ඇති නිර්වාණේ
මගෙයි මමයි පතනා සැමගේ
විවර කළේ නෙතු අඳ සැමගේ
ඔබයි මගේ බුදු පියාණනේ

බලය ධනය රති රඟ හමුවේ
නිරතුරු සට්ටන වේ කතරේ
භවය දවාලන මහ සසරේ
ඔබයි සමිඳුනේ දහම් දෙසුවේ...

**අමිල අගලවත්ත**
නිව්යොර්ක්, ඇමරිකාව.

# රණවරුණට
# ඔබේ ලිපි නිර්මාණ ඕනෑ

යුද හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය මගින් ප්‍රකාශයට පත්කරණු ලබන "රණවරුණ" සඟරාව වර්තමානයේ යුද හමුදාව තුළ ඉහළම ජනප්‍රියත්වයක් දිනා ඇති සඟරාව බව නිරතුරු අප වෙත ලැබෙන ලිපි හා දුරකථන ඇමතුම් මඟින් සනාථ වේ. එබැවින් ''රණවරුණ'' එම තැනට ඔසවා තැබූ ඔබ සැමට අපගේ ගෞරවණීය ආචාරය මෙලෙස පුදකෙරේ.

ස්වේච්ඡා බලසේනාවට අයත් ඒකකවල තොරතුරු හා එහි සාමාජික, සාමාජිකාවන්ගේ නිර්මාණාත්මක හැකියාවන් සඳහා වැඩි ඉඩකඩක් මෙම සඟරාව තුළ වෙන්කලද බොහෝදෙනෙකු ඉන් උපරිම ප්‍රයෝජන නොගන්නා බැව් නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම බොහෝ ඒකක නිරතුරු අප වෙත ලිපි නිර්මාණ යොමු කළද ඇතැම් ඒකක එසේ ලිපි නිර්මාණ එවනු ලබන්නේ ඉතා කලාතුරකිනි. ඒ අතරින්ද කිසිදු තොරතුරක් යොමු නොකරන ඒකකද වේ.

සැම ඒකකයක්ම පාහේ නිරතුරු ඉතා වැදගත කටයුතු ඕනෑ තරම් සිදුකරනු ලබයි. එහෙත් එම තොරතුරු මෙම සඟරාව වෙත ලබා නොදීම හේතුවෙන් ඒ පිළිබඳ කිසිවෙකු දැනුවත් නොවන තත්වයක් මතුවේ. එබැවින් ඒ පිළිබඳ අවධානය යොමුකර ඒකකය තුළ සිදුවන වැදගත් තොරතුරුද සෙබල සෙබලියන්ගේ නිර්මාණද නොපමාව අපවෙත යොමුකරන්නේ නම් බෙහෙවින් අගයකොට සලකමි. .

**රණවරුණට ලිපි එවීමේදී**

"රණවරුණ" යුද හමුදාවේ ප්‍රකාශනයක් බැවින් ඔබ එවන ලිපි නිර්මාණ ඊට ගැළපෙන ඒවා විය යුතුය. විශේෂයෙන්ම යුද හමුදාවේ ප්‍රතිරූපයට හානිවන හෝ සෙබළුන්ගේ චිත්ත ධෛර්ය බිඳවැටෙන නිර්මාණ නොවිය යුතුය.

නිර්මාණ යොමු කිරීමේදී ඒවා ඔබගේ ස්වාධීන නිර්මාණ බවට සහතික කළ යුතුය. එසේ නොමැති අවස්ථාවලදී නිර්මාණයේ මුල් අයිතිකරුගේ අනන්‍යතාව සේම උපුටා ගැනීමක් නම් අදාළ මූලාශ්‍රය පැහැදිලිව සඳහන් කරන්න.

**කවි නිසඳැස්**

සඳැස් කවි නම් උපරිමය පැදි අටකට සීමා කරන්න. නිසඳැස් නම් උපරිමය පේළි 10 - 15 කට සීමා කරන්න.

**විශේෂාංග ලිපි**

උපරිමය තනි පැත්තේ ලියන ලද A.4 ප්‍රමාණයේ FM Abhaya මුද්‍රිත අකුරු පිටු දෙකකට සීමා කරන්න. (නිර්මාණයේ ගුණාත්මක භාවය සළකා බලා අමතර ඉඩකඩ වෙන් කිරීම සිදුකෙරේ)


**ඒකක තොරතුරු**

සංක්ෂිප්ත කර වැදගත් තොරතුරු පමණක් එවීමට කටයුතු කළ යුතු අතර, ඊට සම්බන්ධ ඡායාරූප එවීමේදී සිදුවීමට අදාලව පැහැදිලි ඡායාරූප එවීමට වගබලා ගන්න.

**ඡායාරූප එවීමේදී**

ඡායාරූප JPEG ලෙස එවීමට කටයුතු කළ යුතු අතර, උදා: Excel, Power Point හා Word යන මෘදුකාංග තුළ ඡායාරූප අතුලත් කර එවීමෙන් වලකින්න. තවද ජංගම දුරකතන මගින් ගනු ලැබූ ඡායාරූප එවීමේදී එහි ගුණාත්මක භාවය කෙරෙහිද සැලකිලිමත් විය යුතු අතර, එසේ ලබාගන්නා ඡායාරූප වැඩි ධාරිතාවයකින් යුත් ඡායාරූප විය යුතුය.

සියලුම ඡායාරූප JPEG ලෙස (Resolution 300) හා අකුරු (Font) FM/DL වලින් පමණක් එවන්න. (උදා : FMAbhaya, FMEmani) තවද "ඉස්කෝල පොත, Kandy හෝ SandyaBOI" වර්ගයේ Fonts භාවිතා නොකරන්න.





# පවුල් සංවිධානය

ගව පාලනය, මී මැසි පාලනය සහ කුකුළු පාලනය ආදියෙන් කෙරෙන්නේ ඒ ඒ සතුන් වැඩි වැඩියෙන් බෝකර ඇති කිරීම නිසා, මා මුලදී සිතුවේ උත්පත්ති පාලනයෙන් කෙරෙන්නේද දරුවන් වැඩි වැඩියෙන් ලබාගැනීමේ උපක්‍රමයකැයි කියාය. එහෙත් එය දේශපාලනය සහ මිල පාලනය මෙන් යමක් නැති බංගකර විනාශකර දැමීමේ ක්‍රියා පිළිවෙතක් බව වටහාගත් පසු මමද උත්පත්ති පාලන ක්‍රම ප්‍රචාරය කිරීමේ විනාශකාරි කටයුත්තට බැස්සෙමි.

දෙවියන් විසින් මවනු ලබන මනුෂ්‍ය වර්ගයාට එරෙහිව, සාතන්ගේ මෙහෙයවීම පිට මා මේ කාර්යයට බැස්සේ, වැඩිවන ජනගහණය නිසා මිනිස් සමාජයට මුහුණ දීමට ඇති ආර්ථික සහ සමාජ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා නොව, දරුවන් නැති මට අනුන්ගේ දරුවන් දක්නා විට ඇතිවන අසීමිත ඊර්ෂ්‍යාව තුනී කර ගැනීම සඳහාය. කොතෙකුත් වෙද හෙදකම් කර, පුද පූජා පවත්වා, භාර හාර වීමෙන් පසුව වුවද මට දරු සුරතල් බැලීමට වාසනාවක් නොලැබුණේ මා මෙතෙක් විවාහ නොවී සිටීම නිසා බව මට වැටහුණේ පසුවය.

උත්පත්ති පාලන බෙහෙත් වර්ග, උපකරණ සහ ප්‍රචාරක පත්‍රිකා රැගෙන පළමුවෙන්ම ගියේ මැදිවියේ කාන්තාවකගේ ගෙදරකටය. දරුවන් සමූහයක් විසින් වට කර ගනු ලැබ සිටි ඇයට පැයක් පමණ උපදෙස් දුන්නෙමි. මගේ දේශනයට කන් දුන් ඈ අන්තිමේදී පවසා සිටියේ තමා වඳ ස්ත්‍රියක බවත් දරුවන්ට ඇති ආදරය නිසා එසේ වටාපිටාවේ දරුවන් තමා ළඟට කැඳවාගෙන ඇති බවත්ය.

මම ඊළඟට විශාල බංගලාවක පෝටිකෝවට ඇතුල් වුයෙමි. විශාල කාරයක් නතර කර තරුණයෙක් එහි ඩිකියෙන් බඩු බාමින් සිටියේය. මම උපත්පාලනය ගැන දීර්ඝ දේශනාවක් කළෙමි.

"දෙයියෝ සාක්කි අපි මේ ළමයි නැති හින්දා කතරගමට ගිහිල්ල භාරයක් වෙලා එනව විතරයි. කාර් එකෙං බහින්ඩ හම්බ වුණේ නෑ. මේ වසවත්ති මාරයෙක් ඇවිත් " යයි කාර් එකෙන් බිමට බට කාන්තාවක් දෙස් දෙන්නට වු අතර, ඇගේ සැමියා කමිස අත් දෙක ඉහළට හකුළද්දී මම ඔලිම්පික් වාර්තාවක්ද බිඳ හෙළා ඇඟ බේරා ගත්තෙමි.

මගේ පරෙස්සම තකා මම ඊළඟට නැති බැරි ගෙදරකට ගොඩ වූයෙමි. පාළු ගෙයි වළං බිඳින්නාක් මෙන් මම දේශනා කරන්නට වීමි. උත්පත්ති පාලනයෙන් කෙරෙනුයේ පවුල් සංවිධානය කිරීමක් බව මම පැහැදිලි කළෙමි. "ගෙදරක ළමයින් වැඩි උණාම ඒක මහා අපරාදයක්. වියදම් අධිකයි, ඒක හින්ද එක ළමයෙකුටවත් හරි හැටි සැප දෙන්න බෑ. ඒ හින්ද ළමයි ගාන අඩු කරන්න තමා අපි මේ ව්‍යාපාරය ගෙනියන්නෙ".

"අනේ පිං ඇති මහත්තයෝ ! කොච්චර එකක්ද !" කියා මට සවන් දී සිටි බවලත් අම්මණ්ඩිය එකඟත්වය ප්‍රකාශ කළාය. "මහත්තයට පුළුවන්ද ළමයි අඩු කරන්න !"

"ඔව්, ඔව්"

"එහෙනං මහත්තයෝ, මගේ ලොකු කොල්ල කොහෙ හරි බෝඩිං කරල දාන්න. උගෙං තමා බේරෙන්නම බැරි. එතකොට අපේ ලොකු කෙලී ඒකිගෙ කකුලත් නොංඩියි. කාට හරි හදා ගන්න දෙන්න. එතකොට අපෙ මහ මිනිහත් හරිම බේබද්දා ! ගෙදරින් එළව ගන්නයි මං ඉන්නේ. මහත්තය කියනව නං මගෙ ළමයි ඔක්කොම උනත් බාර දෙන්න මං කැමතියි !"

"නෑ, නෑ - එහෙම ඉපදිලා ඉන්න ළමයි අඩුකරන්න අපි බාර ගන්නෙ නෑ. මං මේ අවෙ ඉපදෙන්න ඉන්න ළමයි නැති කරන්න"

"මොනවා බොලේ, ගස්සා කොරන්න ! ගනුකො බොල ඔය කොස්ස ! කොහෙද යන ගොඩ වෙදෙක් !"

මම තවත් ඔලිම්පික් වාර්තාවක් බිඳ හෙළා කොන්ද බේරා ගත්තෙමි. මා ඊළඟට ගොඩ වූ නිවසේ සිටි කාන්තාවට "උත්පත්ති පාලනය" හා "පවුල් සංවිධාන ක්‍රම" යන යෙදුම් ටිකක් බර වැඩි විය.

"අනේ මහත්තයෝ මට තේරෙන්න සිංහලෙන් කියන්නකෝ !"



".... ඒ කියන්නෙ කොන්ට්‍රෝල් කරනව කියන එකයි. ඉපදෙන්න ඉන්න ළමයි කොන්ට්‍රෝල් කරනව කියන එකයි " මම තේරුම් කළෙමි.

"ආ මේ කොන්ට්‍රෝල්. ඒ කියන්නෙ මහත්තයෝ ඔය රෙදි, හාල්, පරිප්පු, උම්බලකඩ වගෙ කොන්ට්‍රෝල් කරන එකනේ ?"

"අන්න හරි"

"ඈ මහත්තයෝ, එතකොට අපිට ළමයි හම්බුවෙන්නෙ කූපන්වලටද?"

"නෑ නෑ එහෙම උනොත් පෝලිමේ ඉන්න වෙයි " කියාගෙන මම එතැනින් පිට වී ගොස් බස් පෝලිමට ආවෙමි.

බස් පෝලිමේ මා ළඟින්ම සිටි සුරූපි කාන්තාව දුටු මට හිත පාලනය කර ගැන්මට නොහැකිව උත්පත්ති පාලනය ගැන ඇය හා දෙඩීමට සිත් විය. "හලෝ මැඩම්, හව් අබවුට් බර්ත් කන්ට්‍රෝලිං?"

"යර්ස් අයි ලයික්" ඈ සිනාසී එකඟත්වය පළ කළාය.

මම ඇගේ අත බෙහෙත් පෙති කිහිපයක් තබා, විස්තර පත්‍රිකාවක්ද"යූස් එකෝඩිං ටු දිස් ඉන්ස්ට්‍රක්ෂන්ස්"

යයි කීවෙමි.

"තැන්ක් යූ වෙරි මච් " කියා සියල්ල අතට ගත් ඕ තොමෝ මගේ කනට ළං වී, "මේවා මට හුඟාක් ප්‍රයෝජනවත් වෙනවා, මං තවම බැඳල නෑ " යයි සතුටින් පවසා බසය එන තෙක් නොසිට ටැක්සියකට නැඟී නොපෙනී ගියාය.

කෙනෙකු හරි හැටි වටහා නොගෙන එකවරම මාතෘකාවට බැසීමේ ආදීනව වටහාගත් මම "වහෙන් ඔරෝ" භාෂාවෙන් කතා කිරීමට ඉටා ඉදිරියට ගමන් කළෙමි. ගෙයක මිදුලේ කුඩා දරුවන් හසුරුවා ගනිමින් සිටි කාන්තාවක් මගේ කරුණාවට ලක්වූවාය.

"ළමයි ටිකක් දඟයි නේද?" මම මුල පිරුවෙමි.

"අනේ ඔව්"

"ළමයි වැඩි හින්දා වෙන්න ඇති "

"වැඩියක් නෑ - තව දහ දෙනෙක් විතර වැඩිකර ගන්නයි මං උත්සාහ කරන්නෙ"

"දැං කොච්චර ළමයි ඉන්නවද?"

"දහ අටයි "

"ළමයි වැඩි උණාම මව්ගේ ශරීර සෞඛ්‍යයට හොඳ නෑ නේද?"

"ඒක ඉතිං අම්මලාට කියන්න ඕන"

"එතකොට ඔයා?"

"මම අම්ම නෙමෙයි, මම ටිචර් මේක මොන්ටිසෝරි ඉස්කෝලයක්"

ගේට්ටුව සොයා ගත නොහැකිව මම කැරකෙන්නට වූයෙමි. අමාරුවෙන් පාරට පැනගත් මම මොන්ටිසෝරි පාසලක හැඩගත් තවත් තැනකට ඇතුල් වූයෙමි.

"මේ ළමයිගේ අම්මලා ගැන මට විස්තරයක් දෙන්න පුළුවන්ද?" කියා මම ඉස්තෝප්පුවේ සිටි හැඩි දැඩි පුරුෂයාගෙන් ඇසුවෙමි.

"අම්මලා ගොඩක් නෑ. මේ ළමයින්ට එක අම්මයි ඉන්නෙ. ඒ කියන්නෙ මට එක පවුලයි ඉන්නෙ "

"මේක ඉස්කෝලයක් නෙවෙයිද?"

"නෙවෙයි"

"ළමයි?"

"මගෙ. ඇයි අවිශ්වාසයක් තියෙනවද?"

"නෑ ළමයි කී දෙනෙක්ද කියල දැනගන්න සතුටුයි"

"ඒක මට කියන්න බෑ. ඉන්න මං පවුලගෙන් අහල කියන්නං" යැයි පැවසූ ඔහු "ඩාලිං" යයි අඬ ගැසීය. කාන්තාවක් එළියට ආවාය. "අපිට ළමයි කී දෙනෙක් ඉන්නවාද?"

ඈ හිස කස කසා මතක් කරමින් ගණන් කරන්නට වුවාය. "දහ හතයි... නෑ දහ අටයි ... නෑ මහත්තයෝ හෙට කියන්නම් !"

"නෑ ඕනෙ නෑ. හෙට වෙනකොට ගාන තවත් වැඩි වෙන්න පුළුවං, මං මේ කියන්න ආවෙ - ළමයි වැඩි වුනාම කරදර ... "

පුරුෂයා නැගිට්ටේය. "මොකෝ තමුසෙද කන්න බොන්න දෙන්නෙ? තමුසෙට තියෙන රුදාව මොකද? මං නේ ඒක බලාගන්නේ !"

"මොකෝ තමුසෙද ලයිනිං හෝම් එකේ ලගින්නෙ. මංනේ ඒ අමාරුව විඳ ගන්නෙ" කාන්තාව කට ඇරියාය. මම ගෙදර ඇවිත් හති ඇරියෙමි.

මගේ පරමාර්ථය වූයේ ලංකාවේ මහ ජාතිය වන සිංහලයා සුළු ජාතියක් බවට පෙරළා, අනෙක් සුළු ජාතීන්ට තැනක් ලබා දී සිංහල බෞද්ධයාගේ සංසාර ගමන කෙටි කිරීමටය. සිංහලයන් අතර උත්පත්ති පාලන ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා සිංහලයන් අඩු කිරීමේ ව්‍යාපාරයෙන් මට ලැබුණු උපදෙස් සහ සහයෝගයද අතිමහත්ය. වෙන එකක් තබා අඩුවන සිංහල ජනගහණයට වන්දි ගෙවීමක් වශයෙන් තමන්ගේ වර්ගයාගෙන් වැඩියෙන් බෝ කිරීමටද එම ව්‍යාපාරය ඉදිරිපත් වීම කොතරම් පරිත්‍යාගශීල කටයුත්තක්ද?

එහෙම තිබියදීත් මගේ උත්පත්ති පාලන ව්‍යායාමයට සහයෝගය නොදෙන්නේ ඇයි? දැන් මා මෙය ලියන අවස්ථාවේ අම්මා මා ළඟට එයි....

"තෝ මේ කරන අපරාධය ගැන මං ඒ දවස්වල දැනගෙන හිටියනං තොගෙ ඔය ව්‍යාපාරෙ අකුරටම පිළිපදින්නේ මමයි "

... එසේ වූයේ නම් මම අද ජීවතුන් අතර නොසිටිමි. මෙසේ නොලියමි. දැන් මට කරුණු වැටහෙයි. මම දැන් තොපට කියමි. සිංහලයිනි, උත්පත්ති පාලනය කරන්න එපා !

**චන්ද්‍ර අනගිරත්නගේ "නරලොව හොල්මන්" කෘතිය ඇසුරෙනි.**

කවි

# මල් යාය

## සමබරතාව

ගස් අතු ඉපල් වී දුහුවිලි අරටු     බැඳී
මිහිලිය ඉරි තැලී පවසින් වෙහෙස     විඳී
ගොවිදුගෙ මුහුණ මැලවී වපසරිය     නොඳී
දිසිවෙයි නියං රකුසුගෙ සැටි රිදුම     දිදී

සරුපස දියවෙමින් සේදී ඇගිලි     සැදී
ගේ දොර කැඩී මහ ගස් බිම දිගට     නිදී
ජන ජීවිතය නොපැතූ විපතකට     යෙදී
ජල රකුසාගෙ ඇත බිහිසුණු ගතිය     රැඳී

නියගය දිග හැරී වනසයි     පරිසරය
ජල ගැල්මකින් එයි අපමණ     හිරිහැරය
මේවා අවැසි මුත් බැලුවිට     පරතරය
සීමා නොදක වනදේ අඳුරට     බරය

ගිනි උණුසුමට ලිප උඩ රස අහර     ඉදේ
එමගිණි පැතිරුනොත් ගේ දොර විපත     යෙදේ
ලොව හැම දහමටම සීමා පවුරු     රැදේ
සමබර බව සමඟ හොඳ හා නරක     බැඳේ

සැඩ සුළඟකින් වැනසෙන විට හතර     අත
මුදුමද සුළඟ හිත කය සුව ගෙනෙණු     ඇත
සාගර ජලය ගොඩ ගැලුවත්     අපරිමිත
ලිඳකින් මිසක් දැඩි පවසක් නිවෙනු     නැත

අද මිටු කුහක කම් අද පණ     ගසාය
දිව දම් මවගෙ සුන්දර බව     නසාය
සීමා පවුරු ගැන හැමතැන     දෙසාය
ලොව රැකෙනුයේ සමබර බව     නිසාය

**කොස්කඳවල නන්දසේන වීරසිංහ**

## සිත්

අරුණ උදයේ පින්න සිපගෙන
පිපෙන සහසක් මුදු කුසුම්
රේණු අතරට සුවඳ කැවුවේ
නුඹද සිත් අප හට කියන් ..........

හිරු මිලින වූ ගොම්මනේ රැ
හඬන ගනඳුරු දුරුකරන්
පැයු තරුවට එළිය දුන්නේ
නුඹද සිත් අපහට කියන් ...........

ලොවම සනහා සවන් පිනවන
මිහිරි හඬකින් ගයන සුමියුරු
කුරුලු ගීයට තනුව දුන්නේ
නුඹද සිත් අපහට කියන් ...........

විඩාබර වී ලතැවුලෙන් පිරි
සිතට වෙහෙසක් එක් කරන්
සොඳුරු ලොවකට පාර තැනුවේ
නුඹද සිත් අපහට කියන් ...........

සෙ/2ඊ01833 සාලිය ක්‍රිෂාන්ත එදිරිසිංහ
2 ශ්‍රීලංසිරෙ ආධාරක කණ්ඩායම
වැල්වැටිතුරේ  යාපනය
( 2001 වසරේ රණවිරුවා දෙසැම්බර් කලාපයේ පලවූ කවියකි)

## ජීවිතය පාඨමාලාවකි

ජීවිතය
හුදෙක් පාඨමාලාවකි
විටෙක අසමත් වෙති
විටෙක සමත් වෙති
ධෛර්යෙන් දැනුම සොයති
අපහාස විඳිති
උගනති
ජීවිතය,  එයද ?

සෙ/2එල්00815
**ලා/කෝ චතුර කුමාර පීජීඑන්**
2 ශ්‍රීලංවෙබ

## අලුත් අමුත්තෙක් ඇවිත්

රෝස මල් පෙත්තෙන් තැනු
පුංචි අතැඟිලි
සියුමැලිය
මෘදුකමින් වෙලුනු පුංචි පායුග
මව්පියන්ගේ දෙනෙත් අතරේ
නුඹේ දෙනෙත්
සෙව්වෙමි මම....
කවුරුන්ද නුඹ වගේ
නැ. කිසිත් කවුරුත්
නුඹ නුඹම විය යුතුය
උදැසන හිරු සේ
නිවෙන දිලෙනා පහන්තරු සේ

**පී.ජ් නයෝමි ශෂිකලා**
හොරණ

# විශිෂ්ටයන් අතර **විශිෂ්ටයෙකු වී**



6 ශ්‍රීලංජාආබමු ඒකකයට අයත් සෙ/කිහු105423 සාසෙ සුජිත් කුමාර කේ ශ්‍රීලයුපොදුසේබ පුපා - ඇඹිලිපිටිය වෙතින් පැවැත්වූ ලිපිකරු පාඨමාලා අංක 55 සඳහා සහභාගි වී පාඨමාලාවේ සිසුන් 124 දෙනෙකු අතරින් දෙවන ස්ථානය දිනාගනිමින් තම ඒකකයට හා රෙජිමේන්තුවට ඉමහත් කීර්තියක් අත්කර දෙනු ලැබීය.



ආරක්ෂක සේනා මුලස්ථානය (කිළිනොච්චිය) අන්තර් රෙජිමේන්තු සරඹ තරඟාවලියේ දක්ෂතම සරඹ උපදේශකට හිමි සම්මානය 18(සෙව්) බළඇණියට අයත් සෙ/18ජී00127 බනි 11 සෙනෙවිරත්න ඩීඑම් විසින් දිනා ගන්නා ලදී. මෙම තරගාවලිය සඳහා ආසේමු(කිළි) යටතේ රාජකාරි කරනු ලබන නිත්‍ය,ස්වේච්ඡා ඒකක 30ක සරඹ උපදේශකයෝ සහභාගී වූහ.



පසුගියදා ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් දියත් කළ අඛණ්ඩ වැඩ වර්ජනය නිසා බිඳවැටීමට ගිය ලාංකීය ජන ජීවිතය සුරක්ෂිත කිරීමේ අරමුණින් යුද හමුදාව විසින් දියත් කරන ලද op Pluto ක්‍රියාන්විතයට සහභාගීවූ 16(සෙව්) ගැමුණු හේවා බළඇණියට අයත් සෙ/16එෆ්00549 ලා/කෝප්‍රල් මධුසංක යුඑම්එස් හට යුද්ධ හමුදාධිපති විසින් පසුගියදා සේවා ඇගයුම් වාර්තාවක් ලබාදීමට ක්‍රියා කරන ලදී.



ස්වේච්ඡා පුහුණු පාසල දියතලාව වෙතින් පවත්වන ලද ක්‍රියාශීලි පෙළ අණදෙන්නන්ගේ පාඨමාල අංක 44 හැදෑරූ 10(සෙව්) විපාරෙ ඒකකයට අයත් සෙ/10එච්01276 ලා/කෝ සේමසිංහ ජේඑම්පී ප්‍රථම ස්ථානය දිනාගැනීමට සමත් වී ඇත.

# වියත් **කියමන්**

**සාර්ථකත්වය සඳහා වැකි තුනක්**
අනෙක් අයට වඩා වැඩියෙන් දැනගන්න
අනෙක් අයට වඩා වැඩියෙන් වැඩකරන්න
අනෙක් අයට වඩා අඩුවෙන් බලාපොරොත්තු වන්න
**- විලියම් ශේක්ස්පියර්**

වර්තමානය කෙසේ ගෙවන්නේද?.
එය අපේ අනාගතය තීරණය කෙරෙණු ඇත.
**- මහත්මා ගාන්ධි**

වැලිමත ලියන්න ඔබේ දුක්බර කාලය
ගලක ලියන්න ඔබේ හොඳ කාලය
**- ජෝර්ජ් බර්නාඩ් ෂෝ**

නිවැරදි කුමක්ද? එය හැමවිටම ජනප්‍රිය නොවේ. එමෙන්ම ජනප්‍රිය කුමක්ද? එය හැමවිටම නිවැරදි නොවේ.
**- ඇල්බට් අයිස්ටයින්**

සත්‍යයට වඩා උසස් දෙවියෙකු මේ විශ්වයේ නොමැත.
**- මහත්මා ගාන්ධි**

මුදල් කතාකරන විට සත්‍යය නිහඬවන්නේය
**- රුසියානු කියමනක්**

මෝඩයන්ගේ හදවත ඇත්තේ මුව තුළය.
ප්‍රඥාවන්තයාගේ මුව ඔහුගේ හදතුළය.
**- ඈන් ෆැන්ක්ලින්**

ප්‍රීතිය හැර අන් සැමදේම බැඳ තබාගත හැක.
**- ක්‍රිෂ්ණමූර්ති**

බිරිඳ හඳුනා ගැනීමට සැමියාගේ මුහුණ බලන්න.
**- ස්පාඤ්ඤ පිරුළක්**

හොඳ මිතුරෙකු ලැබීමේ හොඳම ක්‍රමය තමා හොඳ මිතුරෙකු වීමයි
**- රැල්ප් ඉමල්ෂන්**

අවශ්‍යතා අඩුවන තරමට චිත්ත සහනය වැඩිවේ.
**- සොක්‍රටිස්**

# කවි

# මල් යාය

### කිරි අම්මා රැකගනිමු...

අම්මා නැති දින පුතු හට කිරි දුන්නා
එළදෙන වුවත් කිරි අම්මෙකි දන ගන්න
දෙවියන් බුදුන් වැ දනිති පන්සිල් ගන්න
ලැජ්ජ නැද්ද මිනිසුනි ගව මස් කන්න

ගොමටික පොහොර එළකිරි පස්ගෝ රසය
ලැබදුන් සතෙකු නොව ඔහුනම් දෙවියෙකුය
කිසිදා වෙනස්වන්නේ නෑ බුදුබණ පදය
කන්නට එපා මියගිය පසු මළ මිනිය

දියුණුවෙලා අලුත් අලුත් මැසින් ඇවිත් කුඹුර වෙතට
සුන්දරත්වේ මැකී ගොසින් ගවයා ගිය කළ ඉවතට
මිල මුදලට විකුණු වාම හරියාවිද මස් කඩයට
ඒකයි සොබා දහම එරෙහි වන්නේ නිතරම රටට

සතෙක් මරා මස්කෑවෙත් උගේ ඇඟෙ ලොම් ගානට
පිච්චි පිච්චි අරන් යනවා හතර අපායට
මියන්නට සැරසි ඇති සතෙක් බේරාගත් පිනකට
දෙව්ලොව සැප සම්පත් ඉතිරෙනවා නුඹේ නමට

සෙ/15එෆ්01068
**සාසෙ ප්‍රියන්ත එස්වයිඑස්**
3(සෙව්) ගැහේබ

### අම්මා

සුවඳින් අඩු නොවන මල නුඹයි අම්මේ
ගතිගුණ වලින් පිරිපුන් වැඩි ඔබමයි අම්මේ
අදාරයේ වැඩියෙන්ම දුන්නෙකත් නුඹමයි අම්මේ
මතු බවයේදිත් ඔබ මගෙමයි අම්මේ

සෙ/17එච්00216
**කෝප්‍රල් චමින්ද කුමාර පීපී**
17 (සෙව්) විපාරෙ

### බුදු සමිඳේ

ඇලෙන ගැටෙන මේ ලෝ දහමේ
නොගැටි නොබැඳි සිටිනා විලසේ
පසක් කළේ මග මේ කල්පෙ
ඔබයි මහා විරු සමිඳේ

විඳින සැපේ ඇති නිර්වාණේ
මගෙයි මමයි පතනා සැමගේ
විවර කළේ නොතු අඳ සැමගේ
ඔබයි මගේ බුදු පියාණනේ

බලය ධනය රති රඟ හමුවේ
නිරතුරු සට්ටන වේ කතරේ
හවය දවාලන මහ සසරේ
ඔබයි සමිඳුනේ දහම් දෙසුවේ...

**අමිල අගලවත්ත**
නිව්යෝර්ක් ඇමරිකාව.

මගේ ලොවට පෑයු රන් දිනිසුරු ඔබය
මා වෙනුවෙන් ඔබේ දිවියම කැප කල
පෙම්බර මගේ අම්මේ...
ඇඟලුම් හලේ දහඩිය හෙලා
මා දූස පාදන්න වෙර දරූ ඔබගෙන්
දුටිමි සෙනහෙසක්
මහමෙර තරම්

මා ලබන ජය පැරදුම හමුවේ
මල් පෙති අග රැඳි පිණිදිය සේ
කඳුලැළි ඇඳ හැලුනේ ඇගෙන්

සරසවියේ අකුරු කරන කළ
ඔබ ඇමතුමක් රැගෙන විමසන විට
පුතේ නුඹ හොඳින් දැයි
ගෙදර බුදුන් ඔබ යලි යළිත් සිහියට නැගේ
ඔබ නොසිටියානම්
අද මම මේ තැන නැත
දහස් වරායක් නමදින්නේම් ඔබේ දෙපා
මගේ බුදු අම්මේ...

සෙ/එල්100140
**සාසෙ ජයලත් බණ්ඩාර එච්එම්එස්ජී**
වෛද්‍ය පරීක්ෂණාගාරය
කොස්ගම.



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

## උද්‍යෝගීමත් සහ ගෞරවනීය වෘත්තියකට

## කාන්තා කෙඩෙට් නිලධාරිණියක වශයෙන්

## අප හා එක්වන්න



### මූලික සුදුසුකම්

- [illegible]
- [illegible] 2018 [illegible] 06 [illegible] 18 [illegible] 22 [illegible]
- [illegible] 5 [illegible] 3 [illegible]

### අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්

- [illegible]
- [illegible] රු. 500,000.00 [illegible]
- [illegible]

### වැටුප්, දීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ

[illegible]

- කැඩෙට් නිලධාරී - රු. 37817.00
- දෙවන ලුතිනන් (විධායක) - රු. 70797.70
- ලුතිනන් (විධායක) - රු. 75069.70
- කපිතාන් (විධායක) - රු. 80613.70
- මේජර් (විධායක) - රු. 85657.70

- [illegible]

### බඳවා ගැනීමේ පිළිවෙත

- [illegible] 2 [illegible]

### අයදුම්පත් යොමුකිරීමේ පිළිවෙත

- [illegible]
- [illegible] රු. 500,000.00 [illegible]

- [illegible] 2018 [illegible] 06 [illegible]
- [illegible] **"ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ කාන්තා කෙඩෙට් නිලධාරිණී"** [illegible]

- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]
- [illegible]

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

**ලිපිනය : බඳවා ගැනීමේ නිලධාරී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව,**
**සාලාව, කොස්ගම.**
**විමසීම් : 036-2255362/ 011-3188558**

**වැඩි විස්තර සහ අයදුම්පත් සඳහා www.army.lk/slavf**
**වෙබ් අඩවියට පිවිසෙන්න.**




# අබිමන් නිදහසේ කාහල නාදය

සැබෑ නිදහස යනු
සමසේ ලැබිය යුතු රිසිසේ විඳගත යුත්තකි.
එසේම එය සමස්ත ශ්‍රී ලංකාවටම විනා
එක් ප්‍රදේශයකට, ජන කොටසකට සීමා නොවිය යුතුය.
1948 දී අප දිනූ නිදහස යළි අහිමි වූ
තිස් වසක අඳුරු යුගයක් අපි පසු කළෙමු.
එකී නිදහස නැවත දිනා ගැනීම පිණිස වූ
අනවරත අරගලයක යෙදෙන්නටද අපට සිදුවිය.
එහිදී බන්දේසියක තබා පුදනු ලැබූ හෝ
නිරායාසයෙන් හිමිවූ නිදහසක් අපි අත් නොවින්දෙමු.
ඔය වූ කලි ඩා බිඳු මෙන්ම ලේ බිඳු ද වගුරා
බොහෝ වැර වෑයම් කොට දිනූ නිදහසකි.

අද අපට මෙන්ම මතු පරපුරටද
නිදහස් නිවහල් දේශයක් උරුමව ඇත.
එහෙත් එය තවදුරටත් සුරක්ෂිත කිරීම
අප හමුවේ පැවරී ඇති අනුලංඝනීය වගකීමකි.
මෙවර 70 වැනි නිදහස අපට බලකර පෙන්වාදෙනුයේ
මුරකාවල් නැති වැටකොටු බැමි නැති සැබෑ නිදහසක අගයයි.
එකී නිදහස සුරැකීමේ උත්තම කාර්යභාරය වෙනුවෙන්
අපි එක්සත්ව එක්සිත්ව පෙළගැසෙමු.



සුවය පරම නිදහස පමණයි තියෙන
මවය උපන් බිම දිවිහිමියෙන් රකින
ජීවය දැවෙනන තුරු ලේ බිඳු වල තරණ
බවය පුරා නැත උරුමය අත්හරින

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ